**වර්ෂ 2022 .11.11 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.45 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
-

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.30 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.45 |
| 3. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.46 |
| 4. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ට්.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 09.25 |
| 5. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.30 |
| 6. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.30 |
| 7. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.30 |
| 8. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.30 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.31 |
| 10. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.31 |
| 11. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.32 |
| 12. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.33 |
| 13. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.33 |
| 14. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.35 |
| 15. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවතී | පෙ.ව. 09.35 |
| 16. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.40 |
| 17. ගරු ප්‍රාසම | එ.ජා.ප. | බී.ආර්.ඒ.එම්.එස්.සෝමරත්න මිය | පෙ.ව. 09.30 |
| 18. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 09.52 |
| 19. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.53 |
| 20. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 09.55 |
| 21. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 09.55 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 09.55 |
| 23. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.55 |
| 24. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 09.56 |
| 25. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.13 |
| 26. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.30 |
| 27. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 10.25 |
| 28. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.25 |
| 29. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 10.30 |
| 30. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 10.30 |
| 31. ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 10.35 |
| 32. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 11.00 |
| 33. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 11.00 |
| 34. ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 11.30 |
| 35. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.45 |
| 36. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 12.30 |

## 01-01 සභා වාර්තාව සහා සම්මත කිරීම.-(2022.10.14 )

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**

2022.10.14 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**

2022. 10.14 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරිමේ යෝජනාව ස්ථිර කරමි.

**සංශෝධන 1.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**.මංගල ඩයස් මහතා :-

2022. 10.14 වන දින මහ සභා වාර්තාවේ තීරන අංක 05-23 සුසාන භූමි පවරාගැනිම යටතේ පරගලතැන්න,නඩුකාරදෙනිය , මලව හා ආරිද්ද සුසාන භූමිද ඇතුලත් විය යුතුය.එසේම 35 පිටුවේ ගිමන්හල සම්බන්ධව විදුලිබිල ගිවිසුම්කරුගෙන් අයකරගතයුතු අතර එය බිල්පතේ සඳහන් මුදල අයකරගතයුතුබව සඳහන් විය යුතුය.

**සංශෝධන 2.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**.ජී.එම්.ජයරත්න මහතා :-

**7 පිටුව අයවැයෙහි සභාපතිතුමාගේ ප්‍රකාශයේ බදුගෙවන ජනතාවට ස්තුතිය පල කර නැති බව හා මාර්ග සම්බන්ධව තොරතුරුලෙස ඒවා තාර,කොන්ක්‍රීට්,බොරළු ආදී ලෙස වර්ග කර දැමීමෙන් තොරතුරු වැදගත් වන බව සඳහන් කලා.**

**සංශෝධන 3.**

**34** පිටුව

**2022.10.11** දින මුදල් කමිටු වාර්තාව සම්බන්ධව 2022. 10.14 වන දින මහ සභා වේ අනුමැතිය ලැබුනු අතර එහි යෝජනාවේ හා තීරනයේ 22.10.01 ලෙස සටහන්ව ඇති අතර එය 22.10.11 ලෙස නිවැරදි විය යුතුය.

**සංශෝධන 4.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය. :-**

2022. 10.14 වන දින මහ සභා වාර්තාවේ තීරන අංක 05-23 සුසාන භූමි පවරාගැනීම යටතේ කීරගල පොදු සුසානභූමිය,දෙවිපහල ඉහලගම පොදු සුසානභූමිය,කීරගල අගලවත්ත පොදු සුසානභූමිය,දෙවිපහල දික්හේන රණවිරු ගම්මාන පොදු සුසානභූමිය ද ඇතුලත් විය යුතුය.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxx** 2022.10.14 වන දින මහ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

**2022.11.11 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ අංක 01-01 යටතේ සභා වාර්තාව සභා සම්මත කිරීම උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**ප්‍රේමරත්න මල්කැකුල,**
**ගරු සභාපති,**

**කුරුවිට ප්‍රාදේශීය සභාව,කුරුවිට.**

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන- නොමැත.

03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-

සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන-නොමැත.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත්කර ඇති ප්‍රශ්න

04-01. 2022.01.01 දින වන විට මෙම සභාවට අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණය රු.10072169.52කි.මෙ වන විට එම මුදලින් අය වී ඇති මුදල රු.1270090.65 කි. ඒ අනුව අයවිමට ඇති මුදල හිඟ මුදල රු.8802078.87 කි.මෙම වර්ෂය අවසන් වන විට මෙම හිඟ මුදල දෙගුනයකට ආසන්න වේ.එබැවින්,

1.මෙම හිඟ මුදල් අයකරගැනිමට ගෙන ඇති පියවර කුමක්ද?

2.එම පියවර මගින් ලබා ඇති ප්‍රගතිය කුමක්ද?

3.සත්‍ය ලෙසම අයකරගත නොහැකි වු බදු කරුවන් හඳුනාගෙන ඇත්ද?ඔවුන් පිලිබඳ ගෙන ඇති පියවර කුමක්ද?

4.බදු පැහැර හරින පුද්ගලයන් පිලිබඳව නීතිමය ගෙන තිබේද?එහි ප්‍රගතිය කුමක්ද?

5.බදු පැහැර ඇති ලේඛනයේ පැරණිම බදුකරු කවුද?ඔහු බදු පැහැරහැර ඇත්තේ කුමන වර්ෂයේ සිටද?

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**මෙම සදහන් තොරතුරු ලබාදිය යුත්තේ කුමන බදු සම්බන්ධවදැයි නිශ්චිතව නොමැති නිසා මෙම තොරතුරු ඉදිරි මහා සභාවේදි ලබාදිම සඳහා ඉදිරි න්‍යායපත්‍රයට යොමු කරන ලෙස යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා

**වරිපනම් හා අක්කර බදු සම්බන්ධව වේ.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**අදාල පිලිතුරු ඉදිරි මහා සභාවේදි ලබාදිම සඳහා ඉදිරි න්‍යායපත්‍රයට යොමු කරන්න.අදාල විෂය නිලධාරි වෙත ද යොමු කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත්කර ඇති ප්‍රශ්න **ඉදිරි මහා සභාවේදි පිලිතුරු ලබාදිම සඳහා ඉදිරි න්‍යායපත්‍රයට යොමු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05.**යථා පරිදි කල්දී ඇති යෝජනා :-

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-

**05-01.**මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ ජයසිංහ මයාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-

මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ ජයසිංහ මයාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-

මේ මාර්ගය පාසැල් ලමුන් විශාල පිරිසක් පයින් යන මාර්ගයක්.විසල් බට අදින්න ලැස්ති උනත් හැදුවේ නෑ.පාර විනාශ උනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

නඩුකාරදෙනිය පාරක්.පැච්කරලත් ගැලවිලා යනවා.කි.මී.1ක් විතර.කාර්මිකනිලධාරී උපදෙස් අරන් හදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රී චන්ද්‍රලතා බණ්ඩාර මිය.

පැරඩයිස් පන්සල හන්දියෙත් පාර විසල් ජල එකෙන් කැඩිලා.ටිකක් හැදුවත් දැන් ලොකු වලක් වගෙයි.වසර කීපයකට පෙර ඒ බෝක්කුව වහලා.දැන් වතුර රැඳෙනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-

කාර්මික නිලධාරි ඇරලා බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රී දයා කස්තුරි මිය.

පැරඩයිස් 6 පටුමග පාර කැඩුවට හදලා නෑ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-

සභාව දැනුවත් කලේ නෑ.කඩලා ඉවරයි.අපේ ලැයිස්තුවේ නෑ.පාරක් නිසා අපිට වගකීමක් තියෙනවා.ජල මණ්ඩලය එක්ක කතා කරලා බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා

**කාපට් වයාපෘතිය නතර කරලා.ලස්සකන්ද පාර දෙපැත්ත කාපට් කලා.ඒබිසි දාලාමැද.ඒවා හේදිලා ගිහින් පාරේ යන්න බැ.ආරංචි අනා හදනවා කියලා.අක්කර 100 පාරත් මග නතර කරලා.කොන්ත්‍රාත් අයටත් පාඩුයි.සල්ලි ගෙවලත් නැළු.ආන්ඩුවට බල කරන්න.එරත්න විතරක් නෙවෙයි.හැමතැනම ඇති.මේවා ඉක්මනට නිම කරන්න කියන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-</u>

**අපි ඒවා මාර්ග සංවර්ධන අදිකාරියට ත් දන්වා හරිමු.සභාවේ වරදක් නෙමේ මේ කටයුතු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව මෙනේරිපිටිය මැල්වත්ත මාර්ගයේ ජයසිංහ මයාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-02.**දිවිනවත්ත මාර්ගය මුල්කොටස පලල් කිරිම ට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-</u>

**දිවිනවත්ත මාර්ගය මුල්කොටස පලල් කිරිම ට මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව දිවිනවත්ත මාර්ගය මුල්කොටස පලල් කිරිම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-03.එක්නැලිගොඩ මහ ඇල කපා පලල්කර සංවර්ධනය කර ජලය බැස යාමට සලස්වා නිවස සහ මාර්ග යටවීම වැලැක්විම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව(රු.1500000.00)**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

**එක්නැලිගොඩ මහ ඇල කපා පලල්කර සංවර්ධනය කර ජලය බැස යාමට සලස්වා නිවස සහ මාර්ග යටවීම වැලැක්විම සඳහා රු. 1500000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමට මහා සභා අනුමැතිය දීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

**මේ ජනතා ඉල්ලිමක්. ඇල සුද්දකිරිම අවශ්‍යයි.කෘෂිවාර්තා අරන් ග්‍රාමනිලධාරි වාර්තා දිලා.මේ ගැටළුව සත්‍යයක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**ඇටංදෙනිය යාය අපි ගියවර වගා කලා.අක්කර 16ක්.නමුත් ගොයම් කපන්න බැරිඋනා.වතුර නැති නිසා.මහඇල වතුර මාර්ගය වල් බිහිවෙලා.කැඩුන තැන් ටික අපි මිනිස්සු දාලා හදවමු.ඇල සුද්ද කරලා දෙන්න.අක්කර 16 ක අස්වැන්න ගන්න හැකි තැනක්.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ප්‍රතිපාදන ලැබෙන පරිදි කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව එක්නැලිගොඩ මහ ඇල කපා පලල්කර සංවර්ධනය කර ජලය බැස යාමට සලස්වා නිවාස සහ මාර්ග යටවීම වැලැක්විම සඳහා රු. 1500000.00 ක ප්‍රතිපාදන ලැබෙන අයුරින් යෙදවිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2020.11.11 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-04 හි උද්ධෘතය**

**05-04.කුරුවිට කැකුලගම හා තැඹිලියන ගම්මාන ජලයෙන් යටවිම වැලැක්විම සඳහා කැකුලගම සිට ගෝනපිටිය දක්වා මහඇල කපා පලල්කර සංවර්ධනය කිරිම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව(1500000.00)**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා**

**කුරුවිට කැකුලගම හා තැඹිලියන ගම්මාන ජලයෙන් යටවිම වැලැක්විම සඳහා කැකුලගම සිට ගෝනපිටිය දක්වා මහඇල කපා පලල්කර සංවර්ධනය කිරිම සඳහා රු. 1500000.00 ප්‍රතිපාදන ලබාගැනිමට මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගමලත් මිය.**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා**

**මුල් අධියර සිදු කලා.එය ඉතා ප්‍රයෝජනවත් උනා. නමුත් පහල ප්‍රෙද්ශයේ ගිල්ම ගහලා හානි උනා.මේක මහජන පීඩාවක් වෙලා. අවශ්‍ය සියළු අංශ වලින් වාර්තා ගමු.ග්‍රාම නිලධාරි වගේම ස්වේච්ඡා සංවිධාන වලිනුත් ගමු.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**ප්‍රතිපාදන ලැබෙන පරිදි කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට කැකුලගම හා තැඹිලියන ගම්මාන ජලයෙන් යටවිම වැලැක්විම සඳහා කැකුලගම සිට ගෝනපිටිය දක්වා මහඇල කපා පලල්කර සංවර්ධනය කිරිම සඳහා රු. 1500000.00 ප්‍රතිපාදන ලැබෙන අයුරින් යෙදවීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-05.අධිකාරිය ගොරකා ඇල මාර්ගයේ අධිකාරිය වැව අසල තුංමංහන්දිය වැසිදිනවලදි පිටාර ජලයෙන් යටවන හෙයින් වැවේ සිට ඇල දක්වා ඇල ප්‍රතිසංස්කරනය කිරීමට ප්‍රතිපාදන ලබාගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනා ව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

**අධිකාරිය ගොරකා ඇල මාර්ගයේ අධිකාරිය වැව අසල තුංමංහන්දිය වැසිදිනවලදි පිටාර ජලයෙන් යටවන හෙයින් වැවේ සිට ඇල දක්වා ඇල ප්‍රතිසංස්කරනය කිරීමට ප්‍රතිපාදන ලබාගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

**අධිකාරිය වැව ලග තුංමංහන්දිය විසිදිනවලදි පිටාර ජලයෙන් යටවෙලා.ජනතාවට පීඩාවක්.වැවේ සිට ඇල දක්වාම ප්‍රතිසංස්කරනය කල යුතුයි. අවශ්‍ය සියළු අංශ වලින් වාර්තා ගමු.ග්‍රාම නිලධාරි වගේම ස්වේච්ඡා සංවිධාන වලිනුත් ගමු.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
**ප්‍රතිපාදන ලැබෙන පරිදි කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව අධිකාරිය ගොරකා ඇල මාර්ගයේ අධිකාරිය වැව අසල තුංමංහන්දිය වැසිදිනවලදි පිටාර ජලයෙන් යටවන හෙයින් වැවේ සිට ඇල දක්වා ඇල ප්‍රතිසංස්කරනය කිරීමට ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2020.11.11 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-04 හි සත්‍ය උද්ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,කුරුවිට.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-06.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ **පොහොරබාව කසල අංගන ඉඩමේ කැලෑවට වැවී ඇති පර ගස් එක් ටිපර් රථයකට රු.250.00 ක් බැගින් අයකර දර සඳහා කපා ගැනිමට බේන්දළුව ඩබ්.එම්.එස්.කුමාරසිරි යන අයට, අවසරය ලබාදීමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනා ව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

කුරුවිට ප්‍රාදේශීය සභාවේ **පොහොරබාව කසල අංගන ඉඩමේ කැලෑවට වැවී ඇති පර ගස් එක් ටිපර් රථයකට රු.250.00 ක් බැගින් අයකර දර සඳහා කපා ගැනිමට බේන්දළුව ඩබ්.එම්.එස්.කුමාරසිරි යන අයට, අවසරය ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා

**කපන්න එපා. මුලින් ගැලවිය යුතුයි.මේ කටයුත්ත කාර්මික නිලධාරි හෝ අධීක්ෂනය කල යුතුයි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**මේ කටයුත්ත කල යුතුද? නෙකල යුතුද කියලා බලමු.ගස් ගැලවිය යුතු පැත්ත බලමු.කාර්මික නිලධාරි උපදෙස් ගමු. අධීක්ෂනයටත් කෙනෙක් දාන්න ඕනි.ගිවිසුම් ගහලා කලයුතුදේ දන්වමු.ඉඩමේ පිහිටිම, මේ කටයුත්ත ගැලපේද බැලිය යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

**මේ පර ශාකය ජල පෝෂක ශාකයක්. එමගින් පසේ තෙතමනය ආරක්ෂාකරමින් පාංශු ඛාදනය වලක්වමින් පසට මනා ආරක්ෂාවක් සපයනවා.භූමියේ පිහිටීම සැලකිල්ලට ගෙන කටයුතු කරන්න.ජල උල්පත් සිඳීයාමේ තර්ජනය,පස සෝදායාම අවධානය දී කටයුතු කරන්න.මිනිස්සු ඉවක් බවක් නැතිව ගස් කපලා දැන් දැඩි ගැටළු.උදාහරනයක්. පැරඩයිස් වනාන්තරයක් තිබුනේ. අතීතයේ දර අවශ්‍යතා පිරිමැසුවා ඒ කැලේ.නමුත් දැන් කැලෑ කපලා. එහේ අයට වතුරත් දැන් නෑ.පතල් කපලා කාන්තාරයක් වෙලා.වගා බිමක් හොඳයි. නමුත් මේ ගැන තවත් හිතන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

**මේ පුද්ගලයා දැනට සමන් දේවාලයේ අක්කර 60 ක පර ගස් ඉවත් කරනවා.ඒක පැතිරිලා ආක්‍රමනශීලි වෙලා.බිම සරුසාර බව නැතිව යනවා.වගා බිමකට සුදුසු නෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මුදිතා ශ්‍රීමතී මියගේ

**ජල පෝෂක ප්‍රෙද්ශවලට බලපෑම බැලිය යුතුයි.ජල පෝෂක වලට කුනු වතුරත් එයිද කියා බලන්න ඕනි.අධීක්ෂනය කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරමු. ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා කිපදෙනෙක් ඒ ප්‍රෙද්ශයේ සිටින නිසා ඒ අය මේ පිලිබඳව අධීක්ෂනයක් කල යුතුයි.මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදි පරිසර නිලධාරි ,කාර්මික නිලධාරී හා වෙනත් අවශ්‍ය අංශයකින් වාර්තාවක් ඊගෙන ඉදිරි කටයුතු සිදු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පොහොරබාව කසල අංගන ඉඩමේ කැලෑවට වැවී ඇති පර ගස් එක් ටිපර් රථයකට රු.250.00 ක් බැගින් අයකර දර සඳහා කපා ගැනිමට බේන්දළුව ඩබ්.එම්.එස්.කුමාරසිරි යන අයට, අවසරය ලබාදීම සම්බන්ධව පරිසර නිලධාරි වාර්තා, කාර්මික නිලධාරි වාර්තා හා අවශ්‍ය අනෙකුත් වාර්තා ද ඊගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

**05-07.වටප්පිටිය පත්බේරිය රබර්කම්හල මාර්ගය තාරදමා පලුදුවසා මාර්ගය ප්‍රතිසංස්කරනය කිරිමට රු.1000000.00 ප්‍රතිපාදන ලබාගැනීම සම්න්ධ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

**මම මෙම යෝජනාව සංශෝධනය කරමි.වටප්පිටිය පත්බේරිය රබර්කම්හල මාර්ගය වෙනුවට වටප්පිටිය බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථාන මාර්ගය පලුදුවසා ප්‍රතිසංස්කරනය කිරිම ට රු.**

**1000000.00 ක ප්‍රතිපාදන දීමට මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව</u> වටප්පිටිය බෝධිරාජ බෞද්ධ මධ්‍යස්ථාන මාර්ගය පලුදුවසා ප්‍රතිසංස්කරනය කිරිම ට රු. 1000000.00 ක ප්‍රතිපාදන දීමට මහා සභා අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-08.පත්බේරිය පොල්කොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සම්න්ධ යෝජනාව.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>
**පත්බේරිය පොල්කොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව</u> පත්බේරිය පොල්කොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**</u>

**05-09.සිරිපා සමයේ ගමන්කරන වාහන සඳහා රථගාලක් ඉදිකිරිමට ර/ පලාදෙනිය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය පිහිටි ඉඩමෙන් භාගයක් හෝ ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධ යෝජනාව.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>

**සිරිපා සමයේ ගමන්කරන වාහන සඳහා රථගාලක් ඉදිකිරිමට ර/ පලාදෙනිය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය පිහිටි ඉඩමෙන් භාගයක් හෝ ලබාගැනීමට කටයුතු කිරිමට යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>
**මෙම සිරිපා වාරයේ වෙනදාට වඩා විශාල බැතිමතුන් පිරිසක් එයි. කොවිඩ් නිසා පසුගිය සමයේ එන්න බැරිඋනා විශාල පිරිසකට. ඒත් දැනට සිරිපාදේ වඳින්න එන පිරිසට වාහන නවත්තන්න ප්‍රමානවත් පහසුකම් නෑ.අපහසුයි.ඒ නිසා ර/ පලාදෙනිය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය**

**පිහිටි ඉඩමෙන් භාගයක් හෝ ලබාගැනීමට කටයුතු කරමු.ප්‍රවේශ පත්‍ර දීලා සභාවට ලාභයක් වෙන විධිහට වැඩේ කරමු.දැනට යන්නේ වාහන තැන තැන දාලා. ඒ අය එනකොට කැලි අඩුවෙලා වාහන වල.බට ගලවලා.තෙල් අදිනවළු.වෙන පැත්තක සංවිධානය උන පිරිසක්ද දන්නෑ.මේ පාසැලේ ළමයි 65 ක් විතර ඉන්නේ. රථගාලක් නොමැති කමින් විශාල පිරිසක් එන එක අඩු වෙනවා. අවශ්‍ය අංශ දැනුවත් කරලා මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරමු.සිරිපා සමය ලංවෙනකොට තමා සේරම මතක් වෙන්නේ.මේ මාර්ගත් ගැටළු.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>
**මේ සම්බන්ධයෙන් සොයා බලා අංශ දැනුවත් කර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා ගේ යෝජනාව අනුව</u> සිරිපා සමයේ ගමන්කරන වාහන සඳහා රථගාලක් ඉදිකිරිමට ර/ පලාදෙනිය විද්‍යාලයේ ක්‍රීඩා පිටිය පිහිටි ඉඩමෙන් භාගයක් හෝ ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධව සොයා බලා අවශ්‍ය අංශ දැනුවත් කර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-10.අඩවිකන්ද වර්ණගල මාර්ගයේ සබරගමුව පළාත් සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඉදිකල නව ශ්‍රිපාද මාර්ගය සඳහා විදුලි ආලෝකය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>

**අඩවිකන්ද වර්ණගල මාර්ගයේ සබරගමුව පළාත් සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ඉදිකල නව ශ්‍රිපාද මාර්ගය සඳහා විදුලි ආලෝකය ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>

**වන්දනාවේ යන පිරිස වැඩිහරියක් යන්නේ අළුත් පාරේ.වාහන යන්නත් පුළුවන්. බැරි හරියේ පයින් යන්නේ.විදුලි අධිකාරිතුමාව දැනුවත් කරලා නව ශ්‍රිපාද මාර්ගය සඳහා විදුලි ආලෝකය ලබාගැනීමට මැදිහත් වෙන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**විදුලි අධිකාරිතුමාව දැනුවත් කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා ගේ යෝජනාව අනුව</u> අඩවිකන්ද වර්ණගල මාර්ගයේ සබරගමුව පළාත් සංවර්ධන අමාත්‍යංශ ප්‍රතිපාදන මත ඉදිකල නව ශ්‍රීපාද මාර්ගය සඳහා විදුලි ආලෝකය ලබාගැනීම සඳහා විදුලි අධිකාරිතුමාව දැනුවත් කර ඉදිරි කටයුතු සිදුකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**05.11.වර්ණගල සිට හැරමිටිපාන දක්වා මාර්ගයේ කඩතොළු තැන් සකසා පඩිබැඳ අත්වැල් දමා සංවර්ධනය කිරීම හා සිතගඟුලේ හඟට කම්බිපාලමක් දැමීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>
**වර්ණගල සිට හැරමිටිපාන දක්වා මාර්ගයේ කඩතොළු තැන් සකසා පඩිබැඳ අත්වැල් දමා සංවර්ධනය කිරීම හා සිතගඟුලේ හඟට කම්බිපාලමක් දැමීම සම්බන්ධව අවශ්‍ය අංශ දැනුවත්කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>
**සිරිපා මාර්ගය පවිත්‍ර කල යුතුයි.ප්‍රාදේශිය ලේකම්ට මේ කටයුත්ත පවරන්න කීවට දිස්ත්‍රික් සම්බන්ධීකරන රැස්වීමේදී ඒ අය කීවා මේකටයුත්ත රැනියා දසලක්ෂේ බහුකාර්ය පිරිසට දෙන්න කියලා.ඊයේ ඒක වෙනස් වෙලා.දින 23ක් හය හත් දෙනෙක් පාර සුද්ද කරන්න වෙන්නේ.ශ්‍රම දායක පිරිස මදි කියලා බෑ කීවා.විශාල මුදලක් යනවා.ඒ නිසා අපිට බෑ කිවා.සභාපතිතුමා ලේකම් එක්ක කතා කරන්න.තීන්දුවක් ගමු.විශාල විධිහට වල් බිහිවෙලා.කැ ාලේ වැව්ලා.10,12 ක් වත් ඕනි.අවසාන කරන්න නම් අද හෙටම පටන් ගන්න වෙයි.**

**ඒ වගේම සීත ගඟුලේ පාලම.ඊයේ වීඩියෝ එකකුත් දැම්මා.හමුදාවේ අය කරඬුව වඩම්මන්නේ අමාරුවෙන්.පාලමක් අවශ්‍යමයි.ප්‍රතිපාදන දෙන්න පළාත් සංචාරක අමාත්‍යංශයට පුළුවන්ළු.ප්‍රා ෙල්ට පාලම මතක් වෙන්නෙත් පාර මතක්වෙන්නෙත් වාරය ලං වෙද්දි.පාලමක් දෙනවා න් හමුදාවෙන් සවි කර ගන්න පුළුවන්.සිරිපා මාර්ගය හමුදාවට භාරගන්න කීවා.පලාබද්දල සිරිපා මාර්ගය හමුදාවෙන් ලස්සනට හැදුවා.හමුදාපතිතුමාව ලිපියක් ලියලා දැනුවත් කරලා අවසර දෙන්න කීවා.ඒ අයගේ අවධානය යොමු කරවන්න.සිරිපා පෙරහැරත් තියෙනවා.ඉතා අගය කලා.කුරුවිට එරත්න සිරිපා මාර්ගය අගය කලා.සමහරුපිළිගැනීමේ උත්සවය ඉතා ලස්සනට කරනවා.අපිට එරත්න පාරත් සිරිපා ද නායක හාමුදුරුවන්ව දැනුවත් කරලා එරත්න සිරිපා මාර්ගයත් සංවර්ධනය කරන්න හමුදාවට දුන්නොත් ඒ අය ඒක උපරිම හොඳට කරනවා.සභා මුදල් ඕනි නෑ.අපි ඒක හමුදාවට දෙමු.ලිඛිතව කරන්න ඕනි.අපි යුතුකමක් ලෙස ප්‍රා ෙද්ශීය ලේකම්ට දන්වමු.අපිට මිනිස්සු කියන අඩුපාඩු හදන්න පුළුවන්.මේ මාර්ග වාරිමාර්ග වෙලා.වහිනකොට පාරේ වතුර ගලනවා ප්‍රපාත වලින් වගේ.පාරම සංවර්දනය කරන්න ඕනි නෑ.අමාරු ටික හමුදාවෙන් කරගමු. ඒ අය ගල්පඩි බැදලා ලස්සනට කරනවා.සුන්දර ස්ථානයක්.එරත්න කන්ද තැන්න පල්ලම ලස්සනයි.හානි නෙ ාවන විදිහට ගල්පඩි බඳින්න පුළුවන්.සභාවෙන් අවශ්‍ය ආයතන දැනුවත්කරලා ලඟි ලඟියේ කරන්න.සිරීපාදෙට බැතිමතුන් පහසුවෙන් වන්දනා කරයි.ස්ථිරව වතුර ගන්න පුළුවන්.අම්බලම්, අවශ්‍ය ස්ථාන වලට මහජන සෞඛ්‍ය පරික්ෂකව දැනුවත් කරලා බට ජලය දෙන්න කියමු.**

**පොලිතින් අවම කරලා ප්ලාස්ටික් අවම කරලා පරිසර සංරක්ෂන ක්‍රම හදමු.පහසුකම් තාම නෑ. කඩ විතරක් නෙමේ.අත්වැල්,ලිස්සන තැන් හදමු. ස්වේච්ඡා සංවිධාන උදව් ගමු.මේවාට වැඩසටහනක් කරමු.මම යෝජනා කලා නිවාඩු නිකේතනයක් හදන්න.හැරමිටිපානේ හරි වර්ණගල හරි හොඳයි.කෑම නෑ.ඒ අවට නිවාඩු නිකේතනයක් හදමු.ප්‍රාදේශීය ලේකම් එක්ක කතා කරලා කරමු.අපිට ආර්ථික අතිනුත් උල්පතක් උනාට ඒ ආදායම් පිටටයි යන්නේ.රථගාල ගැටළුවටත් විසඳුමක් ගමු.මේ අවශ්‍ය සියළු අංශ දැනුවත් කරලා සෘජුව සම්බන්ධ වෙමු.හමුදා මුලස්ථානය හමුදාපතිතුමාව දැනුවත් කරලා පාර සම්බන්ධ කටයුතු කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**දිර්ඝ විස්තරයක් කලා.ඒ අනුව සිරිපාදස්ථානයේ නායක හාමුදුරුවන්ව දැනුවත් කරලා හමුදා මුලස්ථානය දැන්වත්කරලා කටයුතු කරමු.කුරුවිට හමුදා කඳවුරටත් දන්වන්න.ප්‍රාෙදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්වත් දැනුවත් කරමු.අපි සභාවක් ලෙස කල හැකි දේ කලා.හැම වාරයකදිම පාර හැදුවා. නමුත් පළාත් සභාවෙන් අපිට මුදල් ප්‍රතිපූර්නය කලේ නෑ.ප්‍රාදේශීය ලේකම් කිවා සීත ගගුල දක්වා හරි හදන්න කීවා.ඊයේ සාකච්චා කලා.තොරතුරු කතා කලා.කහවතුර ඉසිම,තොරන ඉදිකිරිම.ගියවර ලක්ෂයක් පමන ගියා.මාර්ගය එලි කිරිම.සීත ගගුල දක්වා එලි කල යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>

**සීත ගගුල කිලෝ මීටර් 4 යි. එතනින් එහා ගස් කඩා වැටිල,මාන යාය .උඩට යන්න බෑ.ඉස්සර නම් හදනවා උඩහට.අමාරුම සීත ගගුලෙන් උඩ හරිය.සුදුවැල්ල කැලේ කපන්න පුළුවන්.එතනින් එහා ගොඩක් දුෂ්කරයි. කරනවානම් කරමු.නැත්නම් නොකර ඉමු.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**මුදල් තමා ගැටළුව.ගියවර මුදල් පවා ප්‍රතිපූර්නය කරලා නෑ.ප්‍රාදේශීය ලේකම් කියපු විධිහ තමා මේ.දිස්ත්‍රික් සම්බන්ධීකරන රැස්වීමෙදී කතා කරමු. තීරන ගමු.ජලය, හමුදාව මගින් පාර හැදීම, ඒවාත් කතා කරමු. පාර සම්බන්ධව අවශ්‍ය අංශ දැනුවත්කරලා ක්‍රියාමාර්ග ගමු.තොරන කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා</u>

**තොරනට වඩා පාර ජනතාවට අත්‍යවශ්‍යයි.මේවා පුහු ආටෝප විතරයි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**පෙරහැර ප්‍රචාරය,සිරිපා වාරය ඇරඹිබව දනවන්න , ගෞරවයක් ලෙස තොරන ඕනි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම්ශ්‍රී ධර්මදාස මහතා ගේ යෝජනාව අනුව</u> වර්ණගල සිට හැරමිටිපාන දක්වා මාර්ගයේ කඩතොළු තැන් සකසා පඩිබැඳ අත්වැල් දමා සංවර්ධනය කිරීම හා සිතගඟුලේ ඉහට කම්බිපාලමක් දැමීම සම්බන්ධ ව අවශ්‍ය අංශ දැනුවත්කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-12.නො.04 කැන්දලන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමේ(රු.600000.00) යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා

**නො.04 කැන්දලන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සඳහා රු.600000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
**ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් සිදු කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතාගේ යෝජනාව අනුව නො.04 කැන්දලන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සඳහා රු.600000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-13.කොස්ගල පහලවත්ත මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා පස් කපා සංවර්ධනය කිරීමේ(200000.00) යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා
**කොස්ගල පහලවත්ත මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා පස් කපා සංවර්ධනය කිරීම සඳහා රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් සිදු කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතාගේ යෝජනාව අනුව කොස්ගල පහලවත්ත මාර්ගය බැකෝ යන්ත්‍රයක් යොදා පස් කපා සංවර්ධනය කිරීම සඳහා රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-14.හල්පෙ තැපැල්ගම කනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීමේ (රු.300000.00) යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා</u>**

**හල්පෙ තැපැල්ගම කනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීම සඳහා රු.300000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

**ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් සිදු කරමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx<u> ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතාගේ යෝජනාව අනුව</u> හල්පෙ තැපැල්ගම කනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීම සඳහා රු.300000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-15.තෙප්පනාව ඉහලගම සිට මැදගම වෙල්යාය දක්වා ඇති රජඇල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා රු.600000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා අසනිපවී රෝහල්ගතව ප්‍රතිකාර ලබන නිසා මාහට දැනුම්දුන්නා මෙම යෝජනාව ඉදිරිපත්කරන ලෙස. එසේම මෙම ප්‍රතිපාදන මුදල සංශෝධනය කර 1000000.00 ලෙස ඉදිරිපත්කරන ලෙසද දැනුම්දුන්නා. ඒ අනුව**

**තෙප්පනාව ඉහලගම සිට මැදගම වෙල්යාය දක්වා ඇති රජඇල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතාගේ දැනුම්දීම මත ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත්කල යෝජනාව අනුව_තෙප්පනාව ඉහලගම සිට මැදගම වෙල්යාය දක්වා ඇති රජඇල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා**

**රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-16.වනඉදලකැටිය එස්.කරුණාජීව මයාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා</u>
**මෙම යෝජනාවට අදාලව අවශ්‍ය ප්‍රතිපාදන මුදලද යෝජනාවට ඇතුලත්කරමි. ඒ අනුව වනඉදලකැටිය එස්.කරුණාජීව මයාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු. 500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජීවන් රණතුංග මහතා විසින් ඉදිරිපත්කල යෝජනාව අනුව තෙප්පනාව ඉහලගම සිට මැදගම වෙල්යාය දක්වා ඇති රජඇල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.</u>**

05-17. **කුරුවිට_ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල** ආදාහනාගාරයේ ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමට මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**කුරුවිට_ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල** ආදාහනාගාරයේ අයකරන ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරිමට මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**මේවන විට මෙම ආදාහනාගාරයේ නඩත්තු වියදම්, ගෑස් සඳහා යන වියදම්, විදුලි බිල ආදී සියළු වියදම් ඉහල ගොසින්. ආදාහනා ගාරය නඩත්තු කිරිමට හෝ ප්‍රමානවත් ආදායමක් අවශ්‍යයි.ඒ නිසා ගාස්තු සංශෝදනයකට යාමට වෙනවා.මේවන විටත් අපේ සභාව මගින් අයකරන ගාස්තු වලට වඩා වැඩි අගයකින් යුතු ගාස්තුයි අනෙක් සභා වලින් අයකරන්නේ**

.මේවන විට මේ සභාවේ අයකරන්නේ බලප්‍රදේශය තුල ආදාහනයක් සඳහා රු.10000.00ක් හා බලප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා රු.11000.00ක් ලෙසයි .මේ ගාස්තු සංශෝදනය කල යුතු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

අනෙක් සභාවල ඇත්තටම විවිධ නය අරගෙන ගෙව ගෙවා තමයි ඒ ආදාහනාගාර නඩත්තු කරගෙන පවත්වාගෙන යන්නේ.නමුත් අපේ එක පරිත්‍යාගයක්. පරිත්‍යාග කල අයගේ අරමුන මේ ප්‍රෙද්ශයේ ජනතාවට සුභසාධනයක් ,සේවයක් ලබාදීම.ඒ නිසා පිටත ප්‍රෙද්ශ වලට නම් රු. 1000.00 පමන වැඩි කලත් මේ ප්‍රෙද්ශයට වැඩි කරන්න එපා.මේ ලඟදිත් ගාස්තු වැඩි කලා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
තියෙන ගානට අපි අයකරමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

නඩත්තු ,පඩි, විදුලි බිල ,ගෑස් මිල ගනන් වැඩියි.එහෙම වැඩි නොකලොත් සංවර්ධනයට තියෙන මුදල් අඩුකරලා ඒකෙන් මේ නඩත්තුවට මුදලක් වෙන් කරන්න වෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා
ආදාහනාගාරයට ලැබෙන මුදලින් ඒක නඩත්තු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මෑතක තිබුන ගාස්තුව රු. 8000.00, 9000.00 යි.පස්සේ විදුලි බිල හින්දා වැඩි කලා.10000.00,11000.00 යි.ලාභ අලාභ ගිණුම හැදුවාම පවත්වාගෙන යන්න හැකි නිසා එකඟ උනේ.රු.20000.00 වගේ ගානකට ගියොත් ඒක ඇත්තටම ජනතාවට පීඩනයක්.සහනයක් නෙමෙයි.මේකේ අයවැය නිවැරදිව හදන්න. එතකොට බලන්න පුළුවන්. ඒක නිවැරදි මිල ගනන් එක්ක සභාවට ඉදිරිපත් කරන්න.රු. 10000.00,11000.00 නම් සාධාරනයි. තව කීයක්වත් වැඩිකරන්න බෑ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ කාරනා ඇත්ත.ලබන සභාවාරෙට ආදාහනාගාරේ ලැබීම් වියදම් වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්න. ඊට පස්සේ මේ ගාස්තු සංශෝධනය පිලිබඳව සලකා බලා ගැසට් කිරීමේ කටයුත්ත කරමු.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
ලයිට් බිල අඩුකරන්න සෝලා ලයිට් සවි කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති වන්දන මහතා

**මම ලඟදි ආදාහනාගාරෙට ගියා.ඒ මිදුලේ ලස්සන ගස් තියෙනවා.ලොව්ගසක් තියෙනවා.හොඳ සෙවනක්. නමුත් ගොඩක් පිලිල.මැරිලා යනවා.එදා මම සේවකයන්ට කිව්වා. ඒවා නඩත්තු කල යුතුයි.ගස්වල පිලිල කපා හොඳින් නඩත්තු කල යුතුයි.මේ ස්ථාන අධීක්ෂනය කරන්න. ඒ සේවකයින්ට දැනුම් දෙන්න. ඒ ස්ථාන නඩත්තු කර පවත්වාගෙන යායුතුයි.ගස් මැරුනාට පස්සේ වැඩක් නෑ.ඒ නිසා අදාල නිලධාරින් මේවා පවත්වාගෙන යාම ගැන සෝදිසියෙන් කටයුතු කරවන්න. ඒ වගේම ඒ එතන ඉන්න සේවකයෝ ජනතාව එක්ක සුහදව ඒ රාජකාරිය ඉටු කරනවා.උනන්දුවෙන් කටයුතු කරනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා</u>

**මෘතක ආදාහනාගාරය තුල අඟල් 1 ක විතර වතුර පිරෙනවා වැස්සාම. ඒ පිලිබඳව දැනුවත් කලා. පියවර ගත්තාද?**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**ඒ ස්ථානය සැකසුවා.කාර්මික නිලධාරි යවලා සැකසුවා. තහඩු පහලට ඇවිත් තිබුනේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජනක විමලසිරි මහතා</u>

**ස්තුතියි.මේ ස්ථානය හොඳින් පවත්වාගෙන යාම පිලිබඳව සේවකයින් කටයුතුකලයුතුයි.අධීක්ෂනය කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**දීප්ති මන්ත්‍රිතුමා කීවා වගේ උද්‍යානය පවිත්‍ර කිරීමේ කටයුතු හා ගස් පිලිබඳ කටයුතු වැස්ස නිසා කරගන්න බෑ කීවා.නමුත් දුටු මුල්වතාවේම පිලිල වැනි දේ ඉවත් කල හැකියි.දැනට සුද්ද කරනවා.**

**ලබන සභා වාරෙට ලැබීම් වියදම් වාර්තාවක් සභාවට වාර්තාව ඉදිරිපත් කරන්න.එදිනට ගාස්තු තීරනය කරමු.**

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ පුස්සැල්ල** ආදාහනාගාරයේ ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමට පෙර ගාස්තු සංශෝධනයකට යා යුතු අතර **ලබන සභාවාරයට ආදාහනාගාරයේ විධිමත් ලැබීම් වියදම් වාර්තාවක් ඉදිරිපත් කර ගාස්තු සංශෝධනය කර,** ගැසට් පත්‍රයේ පල කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-18. බ/මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ අ.ග.සි.322 කැබලි අංක 378 න් කොටසක් වන ඇටබැද්ද මූකලාන නමැති රජයේ ඉඩමෙන් ප්‍රමානයක් කෘෂි කටයුතු සඳහා දීර්ඝකාලින බදු ලබාදීම සම්බන්ධව කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

බ/මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ අ.ග.සි.322 කැබලි අංක 378 න් කොටසක් වන ඇටබැද්ද මූකලාන නමැති රජයේ ඉඩමෙන් ප්‍රමානයක් කෘෂි කටයුතු සඳහා දීර්ඝකාලින බදු ලබාදීම සම්බන්ධව කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලීම සඳහා මහා සභා අනුමැතිය ලබාදිමට යෝජනා කරමි.
**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
බ/මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ අ.ග.සි.322 කැබලි අංක 378 න් කොටසක් වන ඇටබැද්ද මූකලාන නමැති රජයේ ඉඩමෙන් ප්‍රමානයක් කෘෂි කටයුතු සඳහා කන්දබඩගමඇතිරාලලාගේ ශ්‍රියාලතා යන අයට දීර්ඝකාලින බදු ලබාදීමටපළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියද ලැබි ඇති අතර ඉඩම් නිලධාරි වාර්තා හා මෙම සභාවේ කාර්මික නිලධාරි වාර්තාද ඉදිරිපත්කර ඇත. මෙය සම්බන්ධව ගැටළුවක් නොමැති නිසා සභාවේ අනුමැතියත් දෙමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව හා** බ/මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ අ.ග.සි.322 කැබලි අංක 378 න් කොටසක් වන ඇටබැද්ද මූකලාන නමැති රජයේ ඉඩමෙන් ප්‍රමානයක් කෘෂි කටයුතු සඳහා දීර්ඝකාලින බදු ලබාදීම සම්බන්ධව කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් විසින් යොමුකර ඇති ලිපිය **අනුව** කන්දබඩගමඇතිරාලලාගේ ශ්‍රියාලතා යන අයට දීර්ඝකාලීන බදු ලබාදීම සම්බන්ධව **මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-19. **කුරුවිට_ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සම්බන්ද** ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරිමට මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
**කුරුවිට_ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සම්බන්ද** ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරිමට මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.
**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.පාසැල් ළමුන්ට ගාස්තු වැඩිකරන්න එපා.
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**
**ඒ අනුව 2023 වර්ෂය සඳහා කුරුවිට_ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තුව රු. 25.00 ක් ලෙසද පාසැල් ළමුන් සඳහා සාමාජික ගාස්තුව 2022 වසරේ ගාස්තුවම වන රු.50.00 ලෙසද වැඩිහිටියන් සඳහා සාමාජික ගාස්තුව රු.200.00 ක් ලෙසද පාසැල් ළමුන් සඳහා සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තුව රු.50.00 ලෙසද වැඩිහිටියන් සඳහා ද සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තුව රු. 50.00 ක් ද පාසැල් ළමුන් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට රු. 2.00 ක්ද වැඩිහිටියන් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට රු. 5.00 ක්ද ලෙස පනවමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සම්බන්ද** ගාස්තු 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමටත් එම ගාස්තු , **මහජන පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තුව රු.25 ක් ලෙසද පාසැල් ළමුන් සඳහා සාමාජික ගාස්තුව 2022 වසරේ ගාස්තුවම වන රු.50.00 ලෙසද වැඩිහිටියන් සඳහා සාමාජික ගාස්තුව රු.200.00 ක් ලෙසද පාසැල් ළමුන් සඳහා සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තුව රු.50.00 ලෙසද වැඩිහිටියන් සඳහා ද සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තුව රු. 50.00 ක් ද පාසැල් ළමුන් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට රු. 2.00 ක්ද වැඩිහිටියන් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට රු. 5.00 ක්ද ලෙස පනවා ගැනීමටත්** මහ සභා **මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-20.** ._කුරුවිට_ප්‍රාදේශීය සභාවේ ගාස්තු අයකරනු ලබන ස්ථාන 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරිමට මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට_ප්‍රාදේශීය සභාවේ පහත** ගාස්තු අයකරනු ලබන පහතින් විස්තර සඳහන් ස්ථාන 2023 වර්ෂය සඳහා රජයේ ගැසට් පත්‍රයේ පල කිරිමට මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.ඒ අනුව

**කුරුවිට මහජන වැසිකිලිය,කුරුවිට සතිපොල, ස්ථිර කඩ කාමර, බෝපත් ඇල්ල රථගාල වාහන ගාස්තු, බෝපත් ඇල්ල නැරඹුම් ගාස්තු, කුරුවිට බස් නැවතුම් පොල අසල භූමිය ගාස්තු, කුරුවිට ඔර්ලෝසු කනුව අසල භූමිය ගාස්තු, කුරුවිට ලොරි රථගාල, ගවමස් ප්‍රවාහන බලපත්‍ර ගාස්තු, හා2023 වර්ෂයට ටෙන්ඩර් මගින් බදු ලබා දිමට නියමිත මස් හා මාළු වෙළඳසැල් ගාස්තු හා ගෝඝාතකාගාර ගාස්තු පිලිබඳව රජයේ මුද්‍රන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට අවශ්‍ය වේ .**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**2023 වර්ෂය සඳහා පහත පරිදි ගාස්තු අයකරමු.**

උප ලේඛණය

| අනු අංකය | ස්ථානයේ නම | රු. | ශත |
|---|---|---|---|
| 1. | කුරුවිට මහජන වැසිකිළිය එක් පුද්ගලයෙක් සඳහාවන ගාස්තුව | 10 | 00 |

උප ලේඛණය

| අනු | ස්ථානයේ නම | රු. | ශත |
|---|---|---|---|

| අංකය | | |
|---|---|---|
| 1. | කුරුවිට සතිපොළ ස්ථිර කඩ කාමරයක් සඳහා දිනකට ගාස්තුව | 150 00 |

උප ලේඛණය

| අනු අංකය | සේවාව | රු. ශත |
|---|---|---|
| 1. | **බෝපත් ඇල්ල රථගාල වෙත පැමිණෙන වාහන සඳහා අයකල යුතු ගාස්තු** | |
| | I.දොර දෙක බස් සඳහා | 200 00 |
| | II.කාර්/ලොරි/තනි දොර බස්/වෑන් සඳහා | 150 00 |
| | III. ත්‍රීරෝද රථ සඳහා | 100 00 |
| | IV. මෝටර් බයිසිකල් සඳහා | 50 00 |
| 2. | **බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා අයකල යුතු ගාස්තු** | |
| | I .දේශීය වැඩිහිටි | 50 00 |
| | II .විදේශීය | **300 00** |
| | III .පාසල් හා අනෙකුත් ළමුන් | 20 00 |

උප ලේඛණය

| අනු අංකය | ස්ථානයේ නම | ගාස්තුව (දිනකට) රු. ශත | |
|---|---|---|---|
| 1. | කුරුවිට බස් නැවතුම්පොළ අසල භූමිය | 2000 00 | විශේෂ අවසරයක් මත සහ පොදු කටයුතත්තක් නොවන අවස්ථාවලදී මෙම ගාස්තු අයකෙරේ. |
| 2. | කුරුවිට ඔරලෝසු කණුව අසල | 2000 00 | |
| 3. | කුරුවිට ලොරි රථ ගාල | 2000 00 | |
| 4. | ඉහත ස්ථාන 3 සඳහා සභාව විසින් හදුනාගත්,ලාභ උපයන ව්‍යාපාර,ආයතන සඳහා | 10 000.00 | |

උප ලේඛණය

| අනු අංකය | සේවාව | රු. ශත |
|---|---|---|
| 1.<br>2. | ගව මස් ප්‍රවාහන බලපත්‍ර ලබා දීම<br>තාවකාලික ගෝඝාතකාගාරයක් සඳහා බලපත්‍ර ගාස්තු | 2000 00<br>2500.00 |

උප ලේඛණය

2023 වර්ෂය සඳහා ටෙන්ඩර් මගින් බදු ලබා දීමට නියමිත මස් හා මාළු වෙළඳසැල්

| | **ඉල්ලුම්කරුගේ නම** | **වෙළඳාම කරනු ලබන ස්ථානය** | **වෙළඳාමේ ස්වභාවය** |
|---|---|---|---|
| 1 | අබ්දුල් අසීස් මොහොමඩ් නසාර් මයා ,<br>අංක 494, මලව, කුරුවිට | වාණිජ - A<br>ගොඩනැගිල්ල | එළ ගවමස් |

| | | | |
|---|---|---|---|
| | | කුරුවිට | |
| 2 | මොහොමඩ් නසාර් මොහොමඩ් රිෆ්කි මයා , 56, මලව, කුරුවිට | වාණිජ - A ගොඩනැගිල්ල කුරුවිට | එළු හා කුකුල් මස් |
| 3 | මොහොම්මදු නුසෙයින් මොහම්මදු රවුජ්. අංක 466/සී/29 තලාවිටිය වත්ත ඇහැලියගොඩ. | කිරිඇල්ල පොදු වෙළඳ සැල, කිරිඇල්ල. | එළ ගවමස් |
| 4 | සුහසිංහ ආරච්චිගේ උදයපාල අංක 164/ A, ෆිනෑන්ස් වත්ත, මානාන, ඉංගිරිය | කිරිඇල්ල පොදු වෙළඳ සැල, කිරිඇල්ල. | මාළු කඩය |
| 5 | විදාන ගමගේ නලින් කිත්සිරි විජේසිංහ මයා,හැරනියාවක කිරිඇල්ල | කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්නය | එළු හා කුකුල් මස් |
| 6 | එම්.කේ.එම්.එස්.එම්. නලීර් මයා අංක 319, පනාවල පාර, ඇහැලියගොඩ | අංක 14 /1බදුවත්ත හන්දිය. | එළ ගවමස් |
| 7 | කුරුවිට ලංකා ධීවර සංස්ථාව | වාණිජ - A ගොඩනැගිල්ල | මාළු කඩය |
| 8 | එම්.කේ.එම්.එස්.එම්. නලීර් මයා අංක 319, පනාවල පාර, ඇහැලියගොඩ | . අංක 14 බදුවත්ත හන්දිය | එළ ගව මස් |

2023 වර්ෂය සඳහා ගෝ ඝාතකාගාර පවත්වාගෙන යාම

| අනු අංකය | ඉල්ලුම්කරු/ලිපිනය | ස්ථානය |
|---|---|---|
| **01.** | **ඒ.ඒ.එම් නසාර් මයා,අංක 494,මලව කුරුවිට.** | **මංකඩහේන ,මලව කුරුවිට** |
| **02.** | **එම්තඑච්.එම් රවුජ් මයා අංක 466/සී/29 තලාවිටිය වත්ත උඩහගම ඇහැලියගොඩ.** | **තලාවිටිය වත්ත උඩහගම ඇහැලියගොඩ.** |

**ඉහත ස්ථාන වලට අයකරන ගාස්තු අදාල වේ.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-**</u>

**නගරේ වැසිකිලිවල වතුර නෑ.සතිපොල පලාතේ යන්න බෑ.සිකුරාදට වෙලෙන්දෝ ආවම ඒඅයට ඒ වැසිකිලි අවශ්‍යතා ඉටුකරගන්න විධිහක් නෑ.පොලේ තියෙන එකට මනුස්සයෙකුට යන්න බෑ. අපිරිසිදුයි. වතුරත් නෑ.**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**</u>
**බ්‍රහස්පතින්දට අයෙක්ව යොදවලා වැසිකිලිය පවිත්‍ර කරවමු.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**</u>

සතිපොල දවසටත් නගරේ මැදත් කඩ.ඒ කඩ හැමදාමත් තියෙනවා.අනවසර කඩ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

බදු ගෙවන අය අපිට බනිනවා.එකම බිස්නස් එක යන්නේ.එකම කෙනා ඒ කඩය කරන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

වතුර ටැංකිය ඉදිරිපිට කඩ දාලා.එළවළු.බදු ගෙවන අය බනිනවා.මුදල් නොාදි අනිත් අය වෙළදාම අනවසරයෙන්. කෝ පාලනයක් .ආදායම් පරිපාලකලා මොකද කරන්නේ? දීර්ඝ කාලෙක ඉඳලයි මේ කඩ තියෙන්නේ.අනවසරයෙන්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

ආදායම් පරිපාලකලා ගිහින් අයින් කලත් ආයෙත් දමලා.මට කියන්න බෑ.අයින් කරන්න.පොලිසිය ඉවත් කලාට ආයේ දානවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

පාලනයක් නීතියක් නැතුව එහෙම යටත් වෙනවද? මෙහෙම ගියොත් සේරම ඇවිත් පදික වේදිකාවෙත් කඩ දමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

සෙනසුරාදා ඔර්ලෝසුකනුව ලඟ හට් ගහලා වෙළදාම.නගරයට එන අයට වාහනයක් බඩුවක් ගන්නකම්වත් නවත්තන්න තැනක් නෑ. කඩෙන් බඩු අරන් නාටාම්වගේ උස්සන් දුර යන්න ඕනි.

වතුර ටැංකිය ලඟ කඩ අයිති අයගේ වාහන මුළු දවස පුරාම නවත්තලා තියෙන්නේ. ඔර්ලෝසු කනුව ලඟත් කඩ.කුරුවිට බස්නැවතුමේ බස් ගහලා.බෝධිය ලඟත් බස්.එතකොට මේ නගරෙට මිනිස්සු ඇවිත් කොතනද වාහනය දාන්නේ?.කිලෝ මීටරයක් දුර බඩුත් අරන් පයින් යන්න නම් බඩු ගන්න ඕනිනෑ මේ නගරෙන්.අනවසර කඩ ඉවත් කරන්න.අපි දාපු ප්‍රතිපත්ති දැන් නෑ.ඔත්තේ ඉරට්ටේ වාහන නැවතුම් ඒවා ඉවරයි.නගරය ක්‍රමවත් කරන්න.නගරය මැද ස්ථිර කඩ වලට මිනිස්සු යන්නෙම නෑ වගේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

අපිට මේ ඔර්ලෝසුකනුව ලග කඩ වලින් විශාල ආදායමක් නෑ.කනුව ලඟ ඒවා අයින් කරන්න.පාරිභෝගික වාහන දමන්න තැනක් නෑ.අපි නගරෙට නිතර යනවා.මේ ගැටළු විසදන්න.ඒ වගේම අර අපේ සති පොල බදු ගත්තාම ඒ ටෙන්ඩරය ගත්ත කෙනා නෙවේද පොලේ වැසිකිලිය පවිත්‍ර කරන්න ඕනි.ඒ අයයි ඒක කරන්න ඕනි. මෙතන කිසිම සාධාරනයක් වෙන්නෑ.නගරේ මැද ඉන්නේත් ඒ අය.ස්කූටරයකටවත් යන්න බෑ.කොස්කඩත් එහෙමයි. විස්සයි විස්සේ හට් ගහලා පිටින් අය ඇවිල්ලයි මේ කඩ දාලා තියෙන්නේ.ඒ ස්ථානය නිදහස් කරන්න. ලොරි පාක් එකේ දාගන්න කියන්න.

අර යූ. ඩී. බිල්ඩිමත් වසරකුත් ගෙව්ලා ගියා.නිකං වහලා.අපි මොකක් හරි දාමු ඒ ගොඩනැගිල්ලෙ

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

දුම්රිය සතු උනාට නාගරික සංවර්ධන අධිකාරියෙන් හැදුවේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

දුම්රිය ඉඩම් බදුගත්තේ සභාවනේ.අපි ඇරලා ටෙන්ඩර් දාමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

අපි අරිමු. කාට හරි දෙමු.ලහේ නාන තොටත් කාට හරි බදු දෙමු.හෙල බොජුන් හලට හරි දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා :-</u>

නාන තොට ගොඩනැගිල්ල කැඩි කැඩියනවා. කිසි පලක් නැතුව. හෙල බොජුන් හලට හරි දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

මුළු පැය 24 ම ඒ අයගේ පාකිං වෙලා නගරය මැද.වාහන අයින් කරගෙන යන්න කියන්න.කන්ටේනර් වගේ වාහන.හැමදාම අපිටයි බනින්නේ මිනිස්සු.අනිත් මන්ත්‍රීලත් මේවා බලන්න. මේ පොදු ජනතාවට තියෙන ගැටවවක්.අපේ කිසිම පුද්ගලික ඥාතියෙක් හිත මිත්‍රෙයක් නගරේ නෑ. පක්ස වෙන්න ඕනි නෑ.අපිට දරුවෙකුට හරි කියන්න දෙයක් තියෙන්න ඕනි.මේ නගරයේ ගැටළු විසඳලා ක්‍රමවත් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

ගරු මන්ත්‍රීතුමන්ලා කුරුවිට නගරයේ තත්වය ගැන කීවා.සභාවෙන් බදු එකතු කරනවා. නමුත් ජනතාවට සේවයක් කෝ?.මේ විවේචන පිලිගත යුතුයි.නීති රෙගුලාසි කෝ?.විවේකයේ නගරය උනාට විවේකයක් වත් පහසුකමක් වත් නෑ.නිලධාරින්ට කාර්ය භාරයක් තියෙනවා.මේ පොල ගිවිසුමට වැසිකිලි නඩත්තුව ත් අයිතියි. ජනතාවට ඒ පහසුකම ලබා දීම. ඒක ඒ අයගේ වගකීමක්.පිරිසිදු කරලා පවත්වාගෙන යන්න ඕනි.වෙන අය දමලා කරලා බෑ.නගරයේ ස්ථාන තියෙනවා ඒ ඒ දේට. මේවා කඩා කප්පල් කරලා අවහිර කරලා බෑ.නිලධාරින්ට වගකිම් පවරන්න.අනවසර වෙළඳාම් ඉවත් කරන්න.සපුරා තහනම් බවට පුවරු ගහන්න.නගරයට ජනතාව එන්න ඇත්තටම තෘප්තිමත් විය යුතුයි.පහසුකම් ඕනි.අපි 45 ම වගකිව යුතුයි. මේ පොදු ජනතාවගේ ප්‍රශ්න.ඒ නිසා වහාම නිලධාරින්ට බලය පවරලා මේ අනවසර කඩ ඉවත් කරලා ,ජනතාවගේ වාහනයක් කඩේට ගොස් එනතුරු නවත්තන්න තැන දෙන්න. දුම්රියදෙපාර්තමේන්තුවේ ඉඩමේ ගොඩනැගිල්ල හැදුවට යු.ඩී. එක කොන්ත්‍රාත්කරු.අපියි දුම්රියදෙපාර්තමේන්තුවට බදු ගෙව්වේ. තව යු.ඩී. එකට සල්ලි ගෙවලා ඊට පස්සේ සී.ජී.ආර්. කිව්වොත් අපේ කියලා?අපේ බලය කාටවත් දෙන්න එපා.පොදු නීතිය ක්‍රියාත්මක කරන්න. සභා තින්දුවක් අරන් ක්‍රියාත්මක වෙමු.අපි බදු ගෙවනවා. දුම්රිය දෙපාර්තමේන්තුවට. අපි පරිභවයට පත් වෙන්න ඕනි නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

ක්ෂේත්‍රයේ කටයුතු වලට නිලධාරියෙකු යොමු කරලා පොල පැත්ත බලන්නත් දාන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

සභා කාර්යාලයේ විශාල පිරිසක් ඉන්නවා.මීට පෙර මෙතරම් පිරිසක් හිටියේ නෑ.නමුත් ඔය රාජකාරීම කලා.ඒ නිසා පිරිසක් ක්ෂේත්‍රෙය් කටයුතු වල යොදවන්න.සතියේ දින නිවාඩු දීලා සෙනසුරාදා ඉරිදා දින යොදවන්නත් පුළුවන්. ඉස්සර පෙරෙට්ටු තිබුනා.වැඩකරන අදාල්ල තියේද?බූට්ස් තියේද? වැඩ බෙදලා තිබුනා. සොයා බැළුවා. ඉතින් වැඩත් කෙරුණා. උදේ 6.00ට එන්න කියන්න. 2.00ට යන්න දෙන්න.නගරේ වතුර ටැංකිය යට කඩ කාමරය ඒක තේ අලෙවි සැලකට ගැලපෙනවා.ඒක දීලා නැත්නම් උපදෙස් දීල කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

සභාවේ වාහන වලට ඒ රියදුරෝ ආදරය නෑ. නඩත්තුවක් නෑ.නිතරම කැඩිලා හදනවා. ට්‍රැක්ටර් නම් අධික ලෙස සේවයේ යෙදෙවෙනවා.ලංකාවේ වැඩිම සම්පත් ප්‍රමානයක් තියෙන සභාව. ඉස්සර සභාවට ප්‍රිමික්ස් යාඩ් එකක් තිබුනා.සභාවේ පාරක් පළුදු උනෙත් කඩිනමින් ප්‍රිමික්ස් දාලා ඒ පළුදු නඩත්තු කලා.නමුත් දැන් ඒ මොකුත් නැතුවත් විශාල සේවක පිරිසක් හිටියත් සේවය වෙනවා මදි. නගරයේ කටයුතු සොයා බලන්න.මමත් අවුරුදු 15ක් පමන මේ දේශපාලනයේ.

ඇත්තටම කල කිරිලා.පිට්ටනියට තාම කනකොල යන්ත්‍රය නෑ.කාලෙත් ඉවරයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසුරිය මහතා :-

මේවන විට පොලට එන වෙලෙන්දන් ප්‍රමාණය අඩුවෙමින් යනවා.එහෙම තියෙද්දි ටවුම මැද අනවසර අය.නගරය අවහිර වෙලා.කඩ අටවගෙන ඉන්න අයට අර පොලේ වෙලෙඳුන් අඩුඋන කඩ දෙන්න පුළුවන්.ඒ අනවසර අයටත් ඉඩක් දෙන්න පුවවන්.පොල බදු කරුට පාලමෙන් එහා බදු දීලා නැනේ.පාර දෙපස අනවසර කඩ ඉවත් කලේ නැත්නම් අනිත් වෙලෙන්දොත් ටවුමට එයි.මිනිස්සු පොලට බහින එකත් සීමා වෙලා.ඒ නිසා දැනුම්දීලා පොලේ එන්නැති අයගේ කඩ අර ටවුමේ ඉන්න අයට දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

මේ ගැටළු සියළු දෙනාට විතැන් කල යුතු නෑ. බලතල තියෙනවා.සභාපති,විෂය නිලධාරීන් ඉන්නවා.මේ හැමදේම බලන්න අපි යන්න ඕනිනෑ.අදාල නිලධාරීන් ලවා කරවන්න.සාධාරනව ඒ කාර්යයන් ඉටු කරන්න.කරන සමහර දේ නීතයානුකූල නෑ.වැසිකිලියේ මුදල් අයකරන්න බෑ.
පනතේ නෑ.අතුරු ව්‍යවස්ථා නැතිව අය කරලා නීතිය හමුවට අයෙක් ගියොත් අපියි වැරදි.ඒවා හදන්න. නගරයේ සිද්ධිය සම්බන්ධව කියන්න තියෙන්නේ බලතල තියෙද්දි නිහඬව සිටීම .පොලීසිය අවශ්‍ය නෑ අපිට බලතල තියෙද්දි.නඩු දමන්න පුළුවන්.මෙවා සම්බන්ධව දැනුවත් මන්ත්‍රිලා නගරේ ඉන්නවා.ක්‍රියාත්මකවීමයි නැත්තේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

සියක් නගර වැඩසටහන යටතේ තමා මේ ගොඩනැගිල්ලට යු.ඩී.එකට ප්‍රතිපාදන දුන්නේ.අපි අඳුනගන්න ඕනි අපි බදු අරන්ද කියලා.බදු අරන්නම් ආයේ අවසර ඕනි නෑ.ඒතැන ගොනුවලින් පැහැදිලි නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>

1970 ඉදන් ගම්සභා කාලේ ඉඳලම ඒ කඩ 7ක් සභාවෙන් පාලනය කලේ.වත්ත බද්දට දීලා ඇස්සට දත නියවන්න ඕනි නෑ.අපි විවෘත කරමු. දිනයක් දාගෙන.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

සිජීආර් කියනවා ඒ අයගේ දේපොලලු.මම මැඩම්ට කතා කලා.බන්දුල ගුනවර්ධන ඇමතිතුමාට කතා කරලා එනවා කිව්වා.නමුත් එදා අසනීප උනා.මේ කටයුතුවලදී අපිට බලතල තිබුනත් ආරක්ෂාවට පොලිසිය ඕනි.අපි ලබන සඳුදා හවස දෙකට සාකච්ඡාකරමු.පොලිසියත් කැඳවමු.නගරේ ගැටළු කතා කරමු.ස්ථානාධිපතිතුමාව කැඳවාගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

අනවසර ස්ථාන ඉවත් කරන්න අදාල නිලධාරින් ඉන්නවා.ඒක ඒ අයගේ රාජකාරිය.අපි සාකච්ජාකරමු.සඳුදා දෙකට අපි මේ ගැන විසඳගමු.සියළු කටයුතු වලට තැන් වෙන් කරගමු.වාහන නතර කරන තැන ගැටළු විසදගමු.ගොඩනැගිල්ල විවෘතකරනවානම් සීමිත ටෙන්ඩර් කරමු.විස්තර සඳුදාට කතා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>
ගඟ ලඟ ගොඩනැගිල්ල සම්බන්ධව මොකද කරන්නේ?.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මන්ත්‍රිකම් තිබුනට සභාව සතු ඉඩම් ගන්න බෑ.ස්වේච්ජා සංවිධානවලට පුළුවන්.ඒත් ඒවයේ සභාපති ලේකම් මන්ත්‍රි කෙනෙක් නම් එ්ත් බෑ.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

කව්රු හරි ඉල්ලන්න.පාලම යටත් වැඩ කල හැකියි.දින 14ක් තුල දෙන්න. මිලක් තීන්දු කල යුතුයි.කලින් රු. 7500 .00 කට දුන්නත් කලේ නෑ. අවලංගු කලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

වතුර ටැංකිය යටත් දෙන්න.රැකියා ලක්සේ කෙනෙක්ව දාලා සභාවෙන් අධීක්ෂනය කරලා අපි උපදෙස් දීලා කරවමු.රු. 10 000.00 දෙන්නම්. කරවමු.ක්‍රමවේදයක් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>

උදේට කොළ කැඳ දවල්ට හකුරු කහට දුන්නත් වටිනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>
ඒ අදහස් හොඳයි. ක්‍රමවේදයකට කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>

ගඟ ලඟ එකනම් කබානා ගහලා බාබකිව් දාලා ලස්සනට කල හැකියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය :-</u>
මේ ස්ථානය අපි කලින් ඉල්ලුවා. ස්වයංරැකියා කරන කාන්තා සංගමයට. දේශිය හෙළ බොජුන් හලක් දැමීමයි අපේක්ෂාව උනේ.මේක සම්මත උන සභා තීරනයක්.හෙල බොජුන් හලක් මේ නගරයට ගොඩක් වටිනවා. ප්‍රදේශයේ කාන්තාවන්ටත් වටිනවා.කතුන් සවිබල ගැන්විමක් සිදුකෙරෙනවා.අපි කව්රුවත් ඒ සංගමයේ සභාපති හෝ ලේකම් තනතුරුවල නෑ.ඒ කටයුත්තට ඒක දෙන්න.සැලසුමක් හැදුවා කාර්මික නිලධාරි මගින්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය :-</u>
මම යෝජනා කරන්නේ සභාවේ මන්ත්‍රිවරියන් 10 ක් ඉන්නවා.ඒ මන්ත්‍රිතුමයන්ගෙන් එක් අයෙක් බැගින් කතුන් 10 දාන්න පුළුවන්දේශිය ආහාර හදන අය.ව්‍යාපෘතියක් ලියලා තියෙනවා.ස්ථානයක් නැතිවයි හිටියේ. ඇත්තටම නිශ්චිතව මේ ව්‍යාපාරය කරන්න ස්ථානයක් ලබා දීම වැදගත්.සභාවේ කාන්තා කමිටුවෙන් මේ යෝජනාව ආවේ.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

උදේ ඉදන් 2.00 දක්වා දේශීය ආහාර 2.00 න් පස්සේ ඉදිආප්ප කොත්තු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එකඟත්වයකට ඇවිත් සදුදාට වාර්තාව දෙන්න.ලියාපදිංචි සමිතියක් වෙන්න ඕනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

සමෘර්ධි අයටත් අවස්ථාවක් දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චන්ද්‍රා බන්ඩාර මිය :-</u>
සමෘර්ධි තියෙන්නේ තියෙන අයට.මේක ස්වයං රැකියා කරන කාන්තාවන් වෙනුවෙන් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>
ටැංකිය ලඟඑක ටෙන්ඩර් කරන්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>
ක්‍රමවේදයක් හදමු. සදුදාට එන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-

අළුත් ගොඩනැගිල්ල යූ.ඩී.එකේ.සම්බන්ධව.මේ වන විට නගරේ පෝර ගන්න තැනක් නෑ.මිටිපොල එකත් වහලා.අපි වගේ නිෂ්පාදන කරන පිරිසය අලෙවිකරගන්න තැනකුත් නෑ.අපනයන දෙපාර්තමේන්තුවෙන් කුරුඳු හෙම දුන්නා.තුන් ගුනයක් ගෙවිය හැකියි.සෙන්ටර් එකක් නෑ.මේ ගොඩනැගිල්ලේ එහා පැත්ත කොටස ඒ වෙනුවෙන් දිය හැකිද? පොදු ඉල්ලීමක්.
සභාවෙන් කරනවා නම් අපිට සැපයුම් කරන්න පුළුවන්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-
එතනට ගැලපෙන සුදුසු දේ කරන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-
පෙ◌ාහොර සම්බන්ධ ගැටළුවකුත් තියෙනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා
නගරයට ගැලපෙන ඒවයි කල යුත්තේ.ව්‍යාපෘති දෙන්න ගැලපෙන ඒවා.හාඩ් වෙයාර් වගේ ඒවා බෑ. ගැලපෙන දෙයක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

කුරුවිට නගර මධ්‍යයේ ගාස්තු වැඩිකරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

පිනැන්ස් වගේ රු.10000.00යි.මල් සමිති වගේ ඒවට රු.2000.00යි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය :-
බෝපත්ඇල්ල තාම පාර්ක් එක හදලානෑ.අඩුපාඩු ගැටළු කීපයක්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

ඇඳුමක් මාරු කරගන්න තැනක් නෑ. ජනතාව දැඩි අපහසුතාවට පත් වෙනවා.වැසිකිළි නෑ. තාවකාලිකව හරි හදන්න. ටිකට් කඩනවානේ.සෙනඟත් එනවා.දෙසැම්බර් වෙනකොට සෙනඟ වැඩියි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා
සැලැස්ම හදලා ටිකක් වැඩ කලා. නමුත් පස්සේ පළාත් සභාවෙන් මුදල් ආවේ නෑ.වැඩ නවත්තලා මුදල් ආවාම ඉතිරිය කරනවා.නමුත් තාවකාලිකව වැසිකිලියක් හදමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ ගාස්තු අයකරනු ලබන ස්ථාන වන කුරුවිට මහජන වැසිකිලිය,කුරුවිට සතිපොල, ස්ථිර කඩ කාමර, බෝපත් ඇල්ල රථගාල වාහන ගාස්තු, බෝපත් ඇල්ල නැරඹුම් ගාස්තු, කුරුවිට බස් නැවතුම් පොල අසල භූමිය ගාස්තු, කුරුවිට ඔර්ලෝසු කනුව අසල භූමිය ගාස්තු, කුරුවිට ලොරි

**රථගාල, ගවමස් ප්‍රවාහන බලපත්‍ර ගාස්තු, හා 2023 වර්ෂයට ටෙන්ඩර් මගින් බදු ලබා දීමට නියමිත මස් හා මාළු වෙළඳසැල් ගාස්තු හා ගෝඝාතකාගාර ගාස්තු ඉහත සඳහන් පරිදි රජයේ මුද්‍රන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-21. 2023 වර්ෂයට අදාල **කුරුවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරි සැලැස්ම සඳහා** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

2023 වර්ෂයට අදාල **කුරුවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරි සැලැස්ම සඳහා** මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.මෙම වාර්තාව වට්ස්ඇප් මගින් ගරු මන්ත්‍රීතුමාලාට යොමුකර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.එමවාර්තාවේ සංශෝධනය කලයුතු දෙයක් වේ නම් ගරු මන්ත්‍රිතුමන්ලා දැනුම් දෙන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තිරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව** අනුව 2023 වර්ෂයට අදාල **කුරුවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරි සැලැස්ම සඳහා** මහ සභා අනුමැතිය ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05-22. කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 01,02 යටතේ ක්‍රියාත්මක වන තෝරාගත් ආයතන වලට අදාල ඉඩම්කොටස් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කුරුවිට **ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලිම් ලිපිය සඳහා** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 01,02 යටතේ ක්‍රියාත්මක වන තෝරාගත් ආයතන වලට අදාල ඉඩම්කොටස් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කුරුවිට **ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලිම් අනුව සභා තීරනයක් ලබාදීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අසංක දිල්ෂාන් මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා :-**

කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදි මෙම සභාවේ පිහිටුවා ඇති කමිටුවකට දැම්මා.ඒ කමිටුව මෙම කටයුත්තටම පිහිටුවා ගත්ත කමිටුවක්.ඒ නිසා ඒ කමිටුවට මෙම කාරනාව යොමු කරලා දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම පිලිබඳව තීරනයක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.ජයරත්න මහතා :-**

**හිඟ බදු ආදියත් රැස්කරගත හැකියි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>
**ලොකුව්‍යාපාර ආදිය තියෙනවා. හිඟ ආදායම් ආදිය ගත හැකියි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>
කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදී කමිටුවකට යොමුකර තීරන ගත්තේ .ඒ නිසා මේ සම්බන්ධව කමිටුවට යොමුකර තීරන ගමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 01,02 යටතේ ක්‍රියාත්මක වන තෝරාගත් ආයතන වලට අදාල ඉඩම්කොටස් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධව, මෙම සභාවේ පිහිටුවා ඇති කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේ දී නිර්දේශ ලබාදෙන කමිටුවට යොමුකර තීරන ලබාගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-23. කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන එවර් ග්‍රීන් ඔටෝ මෝටිව් සමාගම වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CI,CJ,CK හි ඉඩම්කොටස ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කුරුවිට **ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය සඳහා** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන එවර් ග්‍රීන් ඔටෝ මෝටිව් සමාගම වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CI,CJ,CK හි ඉඩම්කොටස ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කටයුතු කිරිම සඳහා කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදී ක්‍රියා කරන කමිටුවට ඉදිරිපත්කර නිර්දේශ ලබාගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන එවර් ග්‍රීන් ඔටෝ මෝටිව් සමාගම වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CI,CJ,CK හි ඉඩම්කොටස ක්

දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කටයුතු කිරිම සඳහා මෙ සභාවේ පිහිටුවා ඇති කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදී ක්‍රියා කරන කමිටුවට යොමුකර තීරන ලබාගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-24. කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන ජී.කේ.යු.සී.කන්ස්ට්‍රක්ෂන් වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CD/CE හි ඉඩම්කොටස ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කුරුවිට **ප්‍රාදේශීය ලේකම් විසින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය සඳහා** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන ජී.කේ.යු.සී.කන්ස්ට්‍රක්ෂන් වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CD/CE හි ඉඩම්කොටස ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදී ක්‍රියා කරන කමිටුවට ඉදිරිපත්කර නිර්දේශ ලබාගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව** අනුව කුරුවිට පැරඩයිස් කර්මාන්තපුරයේ අධියර 02 කොටසේ ක්‍රියාත්මක වන ජී.කේ.යු.සී.කන්ස්ට්‍රක්ෂන් වෙත අ.ග.සි.226 යටතේ අංක R/KRW/2015/431/ අනුරේඛනයේ කැබලි අක්ෂර CD/CE හි ඉඩම්කොටස ක් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධ ව, මෙම සභාවේ පිහිටුවා ඇති කර්මාන්තපුර වලට අදාල ඉඩම් බදු දීමේදී ක්‍රියා කරන කමිටුවට යොමුකර තීරන ලබාගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-25. **කුරුවිට_ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන කටයුතු සඳහා සමික්ෂන මණ්ඩලය පත්කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

**කුරුවිට_ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන කටයුතු සඳහා සමික්ෂන මණ්ඩලයක් පත්කිරීමට යෝජනා කරමි.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -**
එම යෝජනාව ස්ථිර කරමි.හැකි තාක් කඩිනමින් නිම කරන්න.

## ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

මේ සම්බන්ධව සමික්ෂන මණ්ඩලය පහත පරිදි යොදාගෙන කටයුතු කරමු.

1.ප්‍රධාන කාර්යාලය-

1. ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා.
2. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කැළුම් ශ්‍රි ධර්මදාස** මහතා

1..පී.එම්.සල්මියා මිය. (කමිටුවේ සභාපති)
2.පී.ධර්මරත්න මහතා.
3.පී.පී.ඒ.යූ.කේ.අසංකා මිය.
4.ප්‍රභාත් ගුනතිලක මයා
5.දිල්හානි මල්කාන්ති මිය.
6.ඒ.එන්.වාසනා මිය.
7.අනෝජ් මධුසංක මයා
8.ප්‍රසාදි අමරසිංහ මිය
9.වයි.ජයලත් මයා .

2.නාමල්දෙනිය උප කාර්යාලය.

1. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි තරංග නිල්මිණි** මහතා
2. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජීවන් අබේවික්‍රම** මහතා

2.තක්ෂිලා හේරත් මිය.(සභාපති)
3.හර්ෂනී අබේගුනවර්ධන මිය.
4.චම්පා නිරෝෂනි මිය.
5.පී. එන්. සුභාෂිනි මිය.
6.දීප්ති ලක්මාලි මෙය

3.කිරිඇල්ල උප කාර්යාලය.

1. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මාලනී පීරිස් මිය.**
2. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මදූෂානි වීරසිංහ මිය.**

1.නිසංසලා හිටිහාමු මිය.(සභාපති )
2.මහේෂ් වීරවර්ධන මයා .
3.උත්පලා ඒකනායක මෙය.
4.ලක්මිණි වැලිකුඹුර මිය.
5.රංගිකා දිල්හානි මිය.

4.දොඩම්පෙ උප කාර්යාලය.

1. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ශානක දර්ශන** මහතා

1. සඳුනිකා මිය. (කමිටු සභාපති)
2.කේ.ඩී.අයි.හේමන්ති මිය.
3.නිශාන්ති මිය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන කටයුතු සඳහා ඉහත පරිදි සමික්ෂන මණ්ඩලයක් පත්කිරීමට හා කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-26. හදිසි අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සදහා බෝපත් ඇල්ල පරිශ්‍රයට ශබ්දවාහිනී යන්ත්‍රයක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

හදිසි අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සදහා බෝපත් ඇල්ල පරිශ්‍රයට ශබ්දවාහිනී යන්ත්‍රයක් මිලදි ලබා ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

ඇල්ලේ ඉහල ප්‍රදේශවලට අධික වැසි ලැබුන විට කුරුගඟේ ජල මට්ටම සීඝ්‍රයෙන් ඉහල ගොස් අනපේක්ෂිතව ඇල්ල ආසන්නව ගඟේ ජල මට්ටම ඉහල යන බවත් එවැනි අවස්ථාවලදී ඇල්ල නරඹන්නන්ව හදිසි ආපදා තත්වය පිලිබඳව දැනුවත්කිරීමට ක්‍රමවේදයක් නොමැති බවත් ශබ්දවාහිණී යන්ත්‍රයක් යොදාගෙන මෙම තත්වය දැනුම්දීම සදහා යක්ත්‍රයක් ලබාදෙන ලෙසත් ඇල්ල ප්‍රවේශපත්‍රඅලෙවිකරු හරිශ්චන්ද්‍ර මයා විසින් ඉල්ලීම් කර ඇත.ඒ අනුව සුදුසු යන්ත්‍රයක් මිලදී ගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

පසුගිය ඉරිදා අපිත් ගියා ඇල්ලට.100 ක් විතර ඇල්ලේ හිටියා.විනාඩි 15 විතර ගියා හිටිහැටියේ පඩිපෙල ගාවට වතුර නැංගා.මිගමුව හලාවල වගේ දුර ප්‍රදේශවල පිරිසක්.එක යුවලක් දූපතේ .එන්න බැරිව.එරත්නට වැහැලා.මේ යන්ත්‍රයක් වැදගත්.ලබන සදුදා වනවිට වත් සවි කරන්න.නිවේදනයත් නිවැරදිව හදන්න.රෙකෝඩිං අරන් නිතරම භාවිත කලහැකිපරිදි සකසා තබන්න. දූපතේ සවිකල හැකි නම් සුදුසුයි.වීදි පහන් දාලා තියෙනවා.හොඳයි.ස්තුතියි.හන්දියේ ඉඳලා ඇල්ල ලඟටම කැලේ.කපන්න වෙලා.ඒකත් කරවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

පුස්සැල්ල වැව්ලි සමාගම මගින් හැදවු විදුලි බලාගාරය අක්‍රිය වුවිට ඒ වතුර ටික අගලවත්ත බෝක්කුවට පිට කරන්නේ.විශාල වතුරක් වනවා වෙල් යායට. හිතන්න බෑ.දවසක් ඒ කානුවට වැටුන ත්‍රි රෝදරථයක් වතුර පාරට ගසාගෙන ගිහින් පොඩිවෙලා ගියා. ඒතරම් වතුර පාර සැඩයි.ඇල්ල ඉක්මනටම වතුරෙන් යටවෙන්නේ ඒ වතුර පාර හින්දයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>

යනපාරේ පාලම උඩින් වතුර කඳ.දන්නැති අය ඒ පාරේ යනවා වැස්සත්.කාර් එකක් දැම්මා සැඩ පාරින් බේරුනේ යන්තම්.මේක අනතුරුදායකයි.පාලම හැදුවට උස්සලා හැදුවානම් වටින්නේ.මෙතැනින් අනතුරු වෙන්න දෙන්න එපා.යමක් කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

එතන ඇලෙන් බැහැලයි යන්න තිබුනේ.සභාවෙන් සෘජු කම්මකරු ශ්‍රමයෙන් තමයි ඒපාලම හැදුවේ.හලංගොඩ මහත්තයා.ඒ කාලේ තිබුන ප්‍රතිපාදන වලටගැලපෙන්න ඒක හැදුවා. දීර්ඝ කාලයක් ගෙවිලා.දැන්නම් ඒක නවීකරනය කරන්න ඕනි කාලෙත් පහු වෙලා.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>**

හදිසි අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා බෝපත් ඇල්ල පරිශ්‍රයට ශබ්දවාහිනී යන්ත්‍රයක් නිත්‍යානුකූලව මිලදී ගමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** හදිසි අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා බෝපත් ඇල්ල පරිශ්‍රයට ශබ්දවාහිනී යන්ත්‍රයක් නිත්‍යානුකූලව මිලදී ගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-27. බෝපත් ඇල්ල සඳහා ලබා දී ඇති ඔරුව ට ඔරු තට්ටුවක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>**

බෝපත් ඇල්ල සඳහා ලබා දී ඇති ඔරුව ට ඔරු තට්ටුවක් මිලදී ලබාගැනීමට හෝ සුදුසු පරිදි සාදවා ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** බෝපත් ඇල්ල සඳහා ලබා දී ඇති ඔරුව ට ඔරු තට්ටුවක් මිලදී ලබාගැනීමට හෝ සුදුසු පරිදි සාදවා ගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-28. **කුරුවිට_ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මේ වනවිට අක්‍රිය වී පවතින, වගකීම් කාලයද ඉක්මවා ඇති වොට් 150 වීදි පහන් 45 ක් සඳහා අළුත් වැඩියාකිරිමට අවශ්‍ය කොටස් මිලදී ගැනීමට** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

**කුරුවිට_ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මේ වනවිට අක්‍රිය වී පවතින, වගකීම් කාලයද ඉක්මවා ඇති වොට් 150 වීදි පහන් 45 ක් සඳහා අළුත් වැඩියාකිරිමට අවශ්‍ය කොටස් මිලදී ගැනීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන්** මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

**අපේ අවුරුදු 4,5 උන ඒවත් තියෙනවා.විදුලි කාර්මිකශිල්පියාට පුළුවන්ලු හදන්න.ගානක් ගෙවලා හදමුද?මේ කාලේ විදුලි රැහැන් අදිනවා කේබල් දාන්න. විශාල විදි ලාම්පු ප්‍රමානයක් ගලවලා.ඒවා කරන අය හම්බු උනා.සවි කරන්න කිව්වට සවි කරලා නෑ.පාසැල ලඟ වංගුවේ එක හදලා.මතක් කරන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන** මහතා

**බන්ඩල් කලාට පස්සේ ලයින් ටැප් නැතිව දාන්න බෑ.විදුලි බල මණ්ඩලයට කියන්න. සභා කාර්යක් නිසයි ඒ අය කරන්නේ නැත්තේ.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

දැනුවත්කරමු.ඒවා කාර්මික ශිල්පි දාලා හදමු. **අළුත් වැඩියාකිරිමට අවශ්‍ය කොටස් මිල ගනන් කැඳවා මිලදීගෙන සබාවේ විදුලි කාර්මිකශිල්පියා ලවා අළුත්වැඩියා කරගමු.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස්** මහතා

**ප්‍රධාන හන්දි වල ලාම්පු රෙපෙයාර් වලට ගැලෙව්වාම ඒවා හදනකම් සවිකරන්න ඒවාත් ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව **කුරුවිට_ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මේ වනවිට අක්‍රිය වී පවතින, වගකීම් කාලයද ඉක්මවා ඇති වොට් 150 වීදි පහන් 45 ක් සඳහා අළුත් වැඩියාකිරිමට අවශ්‍ය කොටස් මිල ගනන් කැඳවා මිලදීගෙන සබාවේ විදුලි කාර්මිකශිල්පියා ලවා අළුත්වැඩියා කර ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත** විය.**Xxxxxxxxxxxxxx**

**05-29. කුරුවිට_ප්‍රාදේශීය සභාව හා වලදුර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කල කාබනික පොහොර ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නවතා ඇති අතර එහි විදුලි බිල ගෙවිම සම්බන්ධව**

සභා තීරනයක් ලබාගැනීමේ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

**කුරුවිට_ප්‍රාදේශීය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කල කාබනික පොහොර ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නවතා ඇති අතර එහි විදුලි බිල ගෙවීම සම්බන්ධව**
සභා තීරනයක් ලබාගැනීමට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන්** මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**</u>

**රු.360.00ක මුදලක් තියෙනවා.මේ මුදලගෙවමු.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න** මහතා</u>

**ගෙවලා තාවකාලිකව විසන්ධි කරමු.**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**</u>

**විසන්ධි කල හොත් නැවත ලබාගැනීමේදි විශාල මුදලක් වැයවෙනවා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කල කාබනික පොහොර ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නවතා ඇති අතර එහි විදුලි බිල වෙනුවෙන් ඇති රු.360.00 ක මුදල ගෙවීම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>2022.11.11 **දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක** 05-30 **හි උද්ධෘතය**</u>

05-30.කරපිංච ගම්මානයේ හන්දියේ තැපැල් හල ඉදිරිපිට මාර්ගයේ ගමන්කිරීමට නොහැකිව මාර්ගය අවහිර වන ලෙස සැකසී ඇති වල වසා සකසා ගැනීම සඳහා කරපිංච, පදිංචි

ඕ.ඒ. ඉඳුනිල් ගුණසේකර මහතා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය සම්බන්ධ යෝජනාව.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

කරපිංච ගම්මානයේ හන්දියේ තැපැල් හල ඉදිරිපිට මාර්ගයේ ගමන්කිරීමට නොහැකිව මාර්ගය අවහිර වන ලෙස සැකසී ඇති වල වසා සකසා ගැනීම සඳහා කරපිංච, පදිංචි ඕ.ඒ. ඉඳුනිල් ගුණසේකර මහතා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම මහා සභා තීරනයක් ගැනීම සඳහා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රනතුංග මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

අඩි 30ක් පමන දිග වලක්.මෙය කාර්මික නිලධාරිද පරීක්ෂා කලා.ගල්පස් ලෝඩ් 5ක් විතර ඕනිඑ.තලන්නත් වෙයි.ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා** කරපිංච, පදිංචි ඕ.ඒ. ඉඳුනිල් ගුණසේකර මහතා විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම අනුව කරපිංච ගම්මානයේ හන්දියේ තැපැල් හල ඉදිරිපිට මාර්ගයේ ගමන්කිරීමට නොහැකිව මාර්ගය අවහිර වන ලෙස සැකසී ඇති වල වසා සකසා ගැනීම සඳහා කාර්මික නිලධාරි උපදෙස් මත ප්‍රතිපාදන ලැබෙන අයුරින් කටයුතු කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.11.11 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-30 හි සත්‍ය උද්ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

05-31. කුරුවිට_ප්‍රාදේශීය සභාවේ හිඟ වරිපනම් බදු එකතු කිරිම සඳහා 9.9% ක කොමිස් පදනම මත නිලධාරින් යෙදවිමට මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

මෙම යෝජනාවේ සඳහන්වන්නේ 9.9% ක කොමිස් පදනම මත ලෙසයි.නමුත් වරෙන්තු ගාස්තුවට වඩා අඩු අගයක් වනලෙස සියයට අටක් ලෙස සංශෝදනය කරනවා.ඒ අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ හිඟ වරිපනම් බදු එකතු කිරිම සඳහා 8% ක කොමිස් පදනම මත නිලධාරින් යෙදවිමට මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

මම ගෙවන්න කැමතියි. නමුත් හිඟි ලෙස බෑ.නම දාලා එවන්න.මගේ නමට දෙන්න බැරි ඇයි?.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

මේක ගැන ඩයස් මන්ත්‍රිතුමා නිතර සභාවේ කියනවා.හිඟි කියන්නේ හිමිකම කියයි කියන එක. මේ ඩයස් මන්ත්‍රිතුමාගේ ගැටළුව තක්සේරු එකට දනිවා ඇරලා නම හදලා දෙන්න.නමුත් මේ බදු ගෙවියයුතුයි.ආදායම් පරිපාලක ඇරලා පරීක්ෂා කරවලා නම හදලා අරින්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

වරිපනම් ලේඛනය හදන කොට හදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය.:-

වරිපනම් මීටර් 150 දික්කලේ නෑ. අපේ ගෙදරට නෑ.වරිපනම් අයිතියක් අපිට නෑ.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවේ හිඟ වරිපනම් බදු එකතු කිරිම සඳහා 8% ක කොමිස් පදනම මත නිලධාරින් යෙදවිමට මහ සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

05-32. කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා සැප්තැම්බර් මාසයේදි ලබාගත් ඉන්ධන වෙනුවෙන් වවුචර් අංක 1688 මගින් 2022.10.31 දිනැතිව මහා සභාවේ ආවරන

අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇති අතර ඒ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා සැප්තැම්බර් මාසයේදි ලබාගත් ඉන්ධන වෙනුවෙන් වවුචර් අංක 1688 මගින් 2022.10.31 දිනැතිව මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇති අතර ඒ සඳහා** මහ සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

**මුදල් කමිටුවට ඉදිරිපත්කර නැත.නිර්දේශය අරන් ඉදිරිපත් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**මෙය ගෙවීම් කරන ලද්දක්.ඉදිරි ඒවා මුදල් කමිටුවටත් දාලා නිර්දේශය ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා සැප්තැම්බර් මාසයේදි ලබාගත් ඉන්ධන වෙනුවෙන් වවුචර් අංක 1688 මගින් 2022.10.31 දිනැතිව මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇති අතර ඒ සඳහා** මහ සභා අනුමැතිය ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-33. **කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් වාහන සඳහා ඔක්තොම්බර් මාසයේ ලබාගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කිරිම සඳහා** මහ සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් පහත වාහන සඳහා ඔක්තොම්බර් මාසයේදි පහත දිනයන්හිදී හා සැප්.30 දින ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු.373890.00ක මුදලක් සි/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම් කිරිමට** යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

මෙම ගෙවීමට විරුද්ධයි.මේ දිනයන් ඉක්මවා යන්න බෑ.විෂය නිලධාරි ගිහින් මේ බිල්පත් ගේන්න ඕනි.කල් යන්න බෑ.ලබන මස ඉදිරිපත්කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

මෙම බිල්පත් ලැබෙන පිලිවෙල අනුවයි ගෙවීම් කිරිමට ඉදිරිපත්කරඇත්තේ.මුදල් කමිටුවට අත්සන් කලහැකි මුල්‍ය සීමාව ඉක්මවා ඇති නිසයි මෙය මහා සභා අනුමැතියට

ඉදිරිපත්කර ඇත්තේ. කෙසේ වෙතත් මින්පසු ගෙවීම් මුදල් කමිටුවට ත් දමලා නිර්දේශ ගමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට_ප්‍රාදේශීය සභාවට අයත් ඉහත වාහන සඳහා ඔක්තොම්බර් මාසයේදී ඉහත දිනයන්හිදී හා සැප්.30 දින ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු.373890.00ක මුදලක් සි/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-34. පදිංචි ඉඩමට පාරක් සකස්කර ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා ,කිරිඇල්ල,එපිටවෙල සල්ගහහන්දිය පදිංචි එන්.ඒ.අයිරාංගනි මංගලිකා යන අය විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

,කිරිඇල්ල,එපිටවෙල සල්ගහහන්දිය පදිංචි එන්.ඒ.අයිරාංගනි මංගලිකා යන අයගේ ඉල්ලීම අනුව පදිංචි ඉඩමට පාරක් සකස්කර ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.ජයරත්න මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි. මෙය පුද්ගලික ඉඩමක්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**මෙම ඉඩම සම්බන්ධව උසාවියේ නඩුවක් තිබි මේවනවිට එය උසාවි නියෝගයෙන් අඩි 8 ක පාරක් සකසා ගැනීමට අවසර හිමිවී ඇති බව දන්වා ඇත.අදාල ඉඩම හිමි පාර්ශව 5 හා ජාතික හැඳනුම්පත් අංක ඉදිරිපත් කර ඇත. නිත්‍යානුකූලව මාර්ගය සකස්කරගැනීමට හැකිවේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා** කිරිඇල්ල,එපිටවෙල සල්ගහහන්දිය පදිංචි එන්.ඒ.අයිරාංගනි මංගලිකා යන අයගේ ඉල්ලීම අනුව ඔවුන් පදිංචි ඉඩමට නීත්‍යානුකුලව පාරක් සකස්කර ගැනීම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-35. මාර්ගය අවහිර වන පරිදි ඇති විදුලි කණුවේ ආධාරකය ඉවත්කරගැනීම සඳහා පරකඩුව,මෙනේරිපිටිය ,පොල්කොටුව ගම්වාසීන් විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ද යෝජනාව.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

මාර්ගය අවහිර වන පරිදි ඇති විදුලි කණුවේ ආධාරකය ඉවත්කරගැනීම සඳහා පරකඩුව,මෙනේරිපිටිය ,පොල්කොටුව ගම්වාසින් විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම විදුලි බල මණ්ඩලයට යොමු කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

**මෙම අවහිරව ඇති විදුලි කනු ආධාරකය සුදුසු වෙනත් ස්ථානයක සවිකල යුතුවේ.මේ ඉල්ලීම් ලිපියත් සමග කඩිනමින් යොමු කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** මාර්ගය අවහිර වන පරිදි ඇති විදුලි කණුවේ ආධාරකය ඉවත්කරගැනීම සඳහා පරකඩුව,මෙනේරිපිටිය ,පොල්කොටුව ගම්වාසින් විසින් ඉදිරිපත්කර ඇති ඉල්ලීම විදුලි බල මණ්ඩලයට යොමු කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-36.** ඇස්තමේන්තු

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

05-36-1 සිට 05-36- 16 දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතීන් ලබාගෙන කටයුතු කිරීමටත් යෝජනා කරමි.

**05-36-01.**මැදගම හල්දොල ඇල ප්‍රතිසංස්කරනය කිරිම **රු.1800000.00**
**(ගරු ප්‍රාසම)රත්නසිරි මහතා.**

**05-36-02.**කඳන්ගොඩ ජනපදය මාර්ගය පළුදු සැකසිම සඳහා ද්‍රව්‍ය ආධාරදීම.**රු.50000.00**
**ගරු ප්‍රාසමදයා කස්තුරි මිය)**

**05-36-03.**කැකුණහින්න හන්දියේ සිට ගල්වංගෙඩිය දක්වා ශ්‍රිපාදමාර්ගය අළුත්වැඩියා කිරිම. **රු.655239.86**
**05-36-04.**බැවිල විතානකන්ද පාර ප්‍රතිසංස්කරනයකිරිම **රු.80000.00**
**(ගරුප්‍රාසම සම්පත් බොතේජු මහතා)**
**05-36-05.**අඹගහයට දිගනවත්ත මාර්ගය අළුත්වැඩියා කිරීම. **රු.299900.00**
**(ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා )**

**05-36-06.**මැණික්දොල ට්‍රාන්සපෝරමයඅසලින් මාර්ගය කොන්ක්‍රිට් කිරිම. **රු.599738.80**
**(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)**

**05-36-07.**තිඹිරිගස්හේන තුන්දොල මාර්ගය සංවර්ධනය කිරිම. රු.599738.80
(ගරු ප්‍රාසම මංගල ඩයස් මහතා)

**05-36-08.**බටුහේන- කාහේන්ගම දක්වා මහඇල ඇල කපා රොන්මඩ හා අනවශ්‍ය ගස් ඉවත් කිරිම. (ගරු ප්‍රාසම රුවන් අශෝක මහතා) රු.1500000.00

**05-36-09.** ඕවිටිගම මැදගම රජඇලකපා රොන්මඩහා අනවශ්‍ය ගස් ඉවත්කිරිම (ගරු ප්‍රාසමරත්නසිරි මහතා.) රු.1500000.00

**05-36-10.**වලව්වත්තේ සිට දෙල්ගමුවරජමහා විහාරමාවත දක්වා ගංවතුරට යටවීම වැලැක්විමට පරගස්ඕවිට ඇල කපා පලල්කර සංවර්ධනය කිරිම. රු.2000000.00

**05-36-11.**බටුහේන සමගිතරු වොලිබෝල් පිටිය සංවර්ධනය කිරිම. රු.200000.00

**05-36-12.**නව ජනපදය ප්‍රජාශාලාවට යනපාර දෙක අධියර කොන්ක්‍රිට්කිරිම.රු.200000.00

**05-36-13.**කොස්ගොඩ ප්‍රජාශාලාව උඩපාරකොන්ක්‍රිට් කිරිම. රු.200000.00

**05-36-14.**පැරඬයිස් පන්සල අසල සිට වැදගොඩැල්ල දක්වා මාර්ගය යටවීම වැලැක්වීමට ජලය බැසයන ඇල මාර්ගය කපා පලල් කිරිම. රු.1000000.00
(ගරු ප්‍රාසම රුවන් අශෝක මහතා.)

**05-36-15.**වත්තහේන ජලයෝජනාක්‍රමය ව්‍යාපෘතියප්‍රතිසංස්කරනය කිරිම.රු.150000.00
(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)

**05-36-16.**නාමල්දෙනිය ප්‍රජාශාලාව වැඩිදියුණු කිරිම. රු.900000.00
(ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා)

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** 05-36-1 සිට 05-36- 16 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත කිරීමටත් ප්‍රාදේශීය සභා අරමුදලින් සිදු කල නොහැකි කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු සදහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතින් ලබාගෙන කටයුතු කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-37.**නිවිතිගල ප්‍රාදේශීය සභාව මගින් මෙම සභාවේ ගලි බවුසරය ලබාගැනීම සම්බන්ධව ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**නිවිතිගල ප්‍රාදේශීය සභාව මගින් මෙම සභාවේ ගලි බවුසරය ලබාගැනීම සඳහා ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධ ව සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී ආනන්ද මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**නිවිතිගල සභාවේ ගලි බවුසරය අනතුරට ලක්විම හේතුවෙන් මේ වන විට ගලි සේවය සැපයීම දැඩි ගැටළුවක් බවත් තාවකාලික විසඳුමක් ලෙස කහවත්ත සභාවෙන් ඉල්ලාගත් ගලිය නැවත ලබාදෙන ලෙස ඉල්ලා ඇතිබවත් නිවිතිගල සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් අප සභාව සතුව නිශ්කාර්යව පවතින ගලි බවුසරය ලබාදෙන ලෙසත් ඉල්ලා ඇත.එසේම ගලි බවුසරයේ සියළු නඩත්තු කටයුතු වැයවන වියදම් එම සභාවේ වියදමින් සිදු කරන බවත් එම සභාවේ සභාපතිතුමන් විසින් දැනුම්දී ඇත.ඒ අනුව මෙම සභාවේ දැනට කාර්යක නොයෙදවා ඇති ගලි බවුසරය නිවිතිගල සභාවට බවුසරයක් ලබා ගන්නා තෙක් ලබාදෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා විතිගල ප්‍රාදේශීය සභාව මගින් මෙම සභාවේ ගලි බවුසරය ලබාගැනීම සඳහා ඉදිරිපත්කර ඇති ඉල්ලීම් ලිපිය අනුව නිවිතිගල සභාවට ගලි බවුසරයක් ලබාගන්නා තෙක් අප සභාව සතුව නිශ්කාර්යව පවතින ගලි බවුසරය නිත්‍යානුකූලව ගිවිසුම්ගතව ලබාදීමටත් බවුසරයේ සියළු නඩත්තු කටයුතු වැයවන වියදම් එම සභාවේ වියදමින් දැරිය යුතු බවටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 06.කාරක සභාවල වාර්තා

කාරක සභාවල වාර්තා

06-01 මුදල් කමිටු වාර්තාව(2022.11.02 )

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.11.02 දින **මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා **මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා **මන්ත්‍රී පී.එම්.ජයරත්න මහතා :-**
**විගනන වාර්තා අපගේ දැනුවත්වීම සඳහා ලබාදෙන්න.**
**මුදල් කමිටුවේ නිර්දේශ අංක 189,190,196, සම්බන්ධව සාකච්ජා කර ගැටළු නිරාකරනය කර ගන්නා ලදී.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 2022.11.02 **වන දින මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමටත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව.22.11.02

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.11.02 දිනැති කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 22.11.02 දිනැති කාර්මික කමිටු **වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීම සුදුසු බවටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදන ක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(22.10.04)

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**සබාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර ඇත.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-

**ජලය සම්බන්ධව මේ වන විට විශාල ගැටළුවකට මුහුණපාලා තියෙන්නේ.මේක සභාව දැනුවත් විය යුතුයි.සමගි පෙදෙස, උඩකඩ,දෙල්ගමුව,සමගි මාවත,ඉසුරු පෙදෙස,ආදී පැති වලට වතුර නෑ.විසල් ජලය කෙරේ තව දුරටත් පැහැදිලි විශ්වාසයක් තැබිය හැකි තත්වයක් පේන්නෑ.සභාවක් විධිහට අපිට මේ ජනතාවට ජලය සැපයීම වගකීමක්. ඒනිසා කුමන හෝ ආයතනයකින් මෝටරයක් මිලදීගෙන මේ වතුර ලබාදෙන්න වෙනවා.වතුර ටැංකිය පහම ගෙවල් තියෙන අයට පවා වතුර නෑ.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට ප්‍රාෙද්ශීය ලේකම් කාර්යාලයට වතුර නෑ.මම කියන්නේ සති දෙකක් තුල විසල් ජලය නොලැබුනොත් අපි මෝටරයක් ගේමු.මිනිස්සු පව්.නගරයේ ජනතාවට ලිදක් කපන්න තැනක් නෑ.නිවසයි වැසිකිලිවලයි හැරුනාම වතුර ගන්න ලිදක් කපන්න තැනක් නෑ.නගරයේ ජීවත් වෙන මම මේ තත්වය හොඳින්ම දන්නවා.සෘජු සම්බන්ධතා දීලා තියෙන පහත්ප්‍රෙද්ශවල තියෙන ස්ථානවලට**

**වතුර තියෙනවා.එක්නැලිගොඩ සුසානභූමියේ අවට ප්‍රෙද්ශවලට වතුරයන්න නම් ටැංකියට වතුර වදින්න ඕනි.නැතුව ඒ අයට වතුර නෑ.ටැංකිය මීටර් 60ක් උසයි.මෙ ක්‍රම වේද දැන් නෑ.වතුර වදින්නෑ.කොහෙන්හරි විනිවිද ක්‍රමවේදයට විවෘත මිල ගනන් කැඳවලා වොට් 37**

**ධාරිතාවය තියෙන මෝටරයක් මේ මාසේ නිමවෙන්න පෙර ගේන්න.ජනතාව වෙනුවෙන්. ඉදිරියේ පායන කාලේ.වතුර ගැටළුව දැඩි වේවි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න</u>** <u>මහතා</u> **<u>:-</u>**

**වතුර ලැබෙන්නැති අයත් රු. 150.00 ගෙවනවා.යටිතල පහසුකම් අමාත්‍යාංශයට කතා කරලා මෝටරයක් ගන්න.ඕනි තරම් මෝටර් තියෙනවා.ලේකම්තුමිය කතා කරලා බලන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න</u>** <u>මහතා</u> **<u>:-</u>**

**ජල පාරිභෝගිකයන්ට වතුර නෑ. තවත් බල බල ඉන්න වෙලාවක් නෑ. මුදලට හරි කඩිනමින් මෝටරයක් ගෙනත් වතුර නිසි ලෙස සපයන්න.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-</u>**

විසල් ආවත් ජලය තාම නැති විම ලොකු ප්‍රශ්නයක්.කවදා දෙයිද දන්නේ නෑ.ඒ නිසා ජල කමිටුවේ යෝජනාවක් ලෙස සියළු උපාංග සහිතව මෝටරයක් මිලදී ගමු. අපි මේ සම්බන්ධව ජාතික ජලසම්පත් මණ්ඩලයෙන් උපදෙස් ඉල්ලුවා.22.11.04 දිනැතිව , ජලසම්පත් මණ්ඩලයේ ඉංජිනේරු මහතා අපිට උපදෙස්, පිරිවිතර එවා තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන්</u>** <u>මහතා</u> **<u>:-</u>**

**පැනල් අවශ්‍යයි. මුදල් තියාගෙන ඇයි ගේන්නේ නැත්තේ?.අපිට විශාල කරදරයක්.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න</u>** <u>මහතා</u> **<u>:-</u>**

**මහා සභාවේ අනුමැතිය දෙමු ගේන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න</u>** <u>මහතා</u> **<u>:-</u>**

**පිරිවිතර අරන් අඩු මිලට ගේන්න.**

06.04.2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මස්කඩ,මාළු කඩ හා සතිපොළ ටෙන්ඩර්පත් විවෘත කිරීමේ ටෙන්ඩර් කමිටු වාර්තාව.

ගරු සභාපතිතුමා විසින් මෙම 2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් මස්කඩ,මාළු කඩ හා සතිපොළ ටෙන්ඩර්පත් විවෘත කිරීමේ ටෙන්ඩර් කමිටු වාර්තාව මහා සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත්කරන ලදී.

06.05. කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු පදනම මත ලබාදීම සම්බන්ද සාකච්ඡා වාර්තාව (2022.10.08)

ගරු සභාපතිතුමා විසින් කිරිඇල්ල නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු පදනම මත ලබාදීම සම්බන්ද සාකච්ඡා වාර්තාව (2022.10.08 ) මහා සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත්කරන ලදී.

07. <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

07-01. 2022 සැප්තැම්බර් මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-</u>**

2022 සැප්තැම්බර් මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී දයා කස්තුරි මිය-</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**
හිඟ මුදල් කඩිනමින් අය කරගැනිමට කටයුතු කරන ලෙසත් එය දැඩි අවශ්‍යතාවක් බවත් අවධාරනය කරන ලදී.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx2022 සැප්තැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-02. 2022 මස ගෙවීම් වාර්තාව

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**
2022 ඔක්තොම්බර් මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා ගම්ලත් මිය :-</u>**
2022_ ඔක්තොම්බර් මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-</u>**
එම යෝජනාව ස්ථිර කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**
නගරේ සම්මන්ත්‍රනශාලාවට බිලෙන් සියයට පනහක් ගෙවීම අනුමත කලේ .ලබෙන මුදලින්. නමුත් පස්සේ සම්පුර්න බිලම ගෙවලා.මන්ත්‍රී යෝජනා වලටත් ගෙවනවා කියන එකඟත්වය ඇතුවයි අනුමත කලේ. අන්ති මන්ත්‍රි යෝජනා වලටවත් ප්‍රතිපාදන ලබාදෙන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

පසුව බිල් දෙකක් ආවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**
ජී.අයි.එස්. තාක්ෂනයට නිලධාරින් යොදවන්නේ සතියේ දිනවලදිද? එසේම 2021 වර්ෂයේ හිඟ ආදායම් එකතුකලාට ගෙවීම් කරන එක සාධාරන නෑ.වසර 5ක පමන එහා ඒවා කමක් නෑ.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

සතියේ දිනවල.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

නාමල්දෙනිය ගිමන්හල විදුලි බිල අය කර ගන්න.ඒ බිල බදු ගත් අයයි ගෙවන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

ආදායම් පරිපාලකට කියන්න ලඟ වසර වල ඒවා එකතුකරන්න කියලා. මොකද ඒක ඒ අයගේ ර්‍රකියාවට අයත් දේ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** 2022 ඔක්තොම්බර් මස ගෙවීම් වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08.වෙනත් කරුණු.

**<u>2022.11.11 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද මහා සභාවේ වෙනත් කරුනු අංක 08-01 හි උද්‍යතය</u>**

08-01.වෙනත් කරුණු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මුණසිංහපුර එපිටවෙල මාර්ගය යාකෙරෙන සභා මාර්ගයක් වෙන පල්ලෙකන්ද මාර්ගයේ සිරිසෝම මහතාගේ**

**නිවස ළඟ ගමනාගමනය අවහිර වන ලෙස ලොකු ගලක් තියෙනවා.ඒක ඉවත්කරලා දෙන්න.කාර්මික නිලධාරි වාර්තා අරන් කටයුතු කරන්න.මේ ගල ඉවත්කිරීමට බලය සිරිසෝම මහතාට පැවරුවහොත් එම ගල ඒ මහතාට ඉවත්කල හැකි බව දැනුම් දුන්නා. ඒනිසා මේ සම්බන්ධව නීත්‍යානුකූල අවසර ලබාදීම සඳහා කටයුතු කරන්න.**

**2022.11.11 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද මහා සභාවේ අංක 08-01 හි උද්‍ධතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්. ආර්.විරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

08-02.වෙනත් කරුණු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>
**මෙනේරිපිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයට වතුර මෝටරයක් ඉල්ලුවා.වටප්පිටිය නිල නිවාසයේ තියෙනවා භාවිතයට නොගන්නා වතුර මෝටරයක්.සභාවෙන් දීපු එකක්.ඒක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිකාර්යාලය හරහා මෙනේරිපිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයට ලබා දෙන්න.**
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>
**එම වතුර මෝටරය මෙනේරිපිටිය සෞඛ්‍ය මධ්‍යස්ථානයටලබා දීමට පියවර ගමු.**

08-03.වෙනත් කරුණු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**පැරඩයිස් අඹගස්හන්දිය දක්වා වැසිදිනවලදී ප්‍රධාන මාර්ගය යටවෙනවා.නව ජනපදය පන්සල ලග.රණසිංහ පෙදෙස.මීටර් 200 විතර යටවෙනවා.කානු වල නඩත්තුවක් නෑ.පාසැල් යන ලමයි ගොඩක් ඉන්නවා.ස්කැවේටර් එකක් භාවිත කරලා පැයක් යයි. මේ වැඩේ කරන්න.ත්‍රිරෝද රථ යන්නත් බෑ.ලමයි ට පාසැල් යන්න ලොකු පීඩාවක්. මේක සකසන්න.අපිට පැයකට ස්කැවේටරයක් දෙන්න. මේ කානු ගොඩදාගන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

**රණසිංහ පෙදෙසේ පාරේ කෙලවරේ ඇලිකට් එකක ජල බැස්මට බාධා ලෙස තියෙනවා. ඒක කඩන්නත් බෑ. වාරිමාර්ග අවසර ගන්න ඕනි.වැඩකුත් නෑ. පැරනි ඇලිකට් එකක.අපි කිප දෙනෙක් එක්ක මේක කඩලා දාමු.මුව පලාතම වතුරෙන් යටවෙනවා මේක නිසා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්ද්‍රලතා බණ්ඩාර මිය.</u>
**නව ජනපදය බෝක්කුව වහලා.ඒක අරින්න.එතකොට හරි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>
**කාර්මික නිලධාරි යවා පරීක්ෂා කර කටයුතු කරමු.**

**08-04.වෙනත් කරුනු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

පනත අනුව යෝජනා ඉදිරිපත්කරන්නේ සභාවට. ඔබතුමාට.ඔබතුමාගේ කාර්යය වෙන අයකරන්න බෑ.ඔබතුමා මැදිහත් වෙන්න. වෙන අය බාධා කරන්න එපා.අට දෙනෙක් අත්සන් කරලා දුන්න යෝජනාවක්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

ගැටළු ඇතිකරගතයුතු නෑ.අත්සන් කර සභාගත කරගන්න.සියළු දෙනා යෝජනාව ඉදිරිපත් කරද්දි ඇහුම්කන් දිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

අපිට සැලකුව ආකාරය මතකයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා

මීට පෙර මැදිගොඩැල්ල මාර්ගය හරහා කැපුවා.දිප්ති මන්ත්‍රිතුමා පොඩිඇල දක්වා කැපුවා.ඇලිකට් ඉවත් කරන්න පුරාවිද්‍යා අවසරය ඕනි.ගොවිජන සේවා එකෙන් අවසර දෙනවා.ගුවන්විදුලි සංස්ථා පාරත් වතුර වලක් වෙනවා. ඇස්තමේන්තු හැදුවත් මුදල් නෑ.මගේ කොට්ටාශෙ මුදල් තියේනම් කරනවා.

මෙම අවස්ථාවේ සභාවේ දැඩි ගෝෂා පැවතුනි.

**08-05.**වෙනත් කරුනු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා

නාමල්දෙනිය පරකඩුව අසනිපව රෝහල්ගතවී ප්‍රතිකාරලබන දරුවෙක් ඉන්නවා.ඉනෙන් පහල පන නෑ. දුරකථනය නැතිවෙලා.හැකි උදව් කරමු.

**08-06.**වෙනත් කරුනු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

කිතුල්පේ ග්‍රාමසංවර්දන සමිතිය මගින් ඉල්ලීමක් කර තිබෙනවා.පාතගම කරපිංච මාර්ගයේ පි.සිරිල් මහතාගේ නිවස ඉදිරිපිට කිතුල්පෙ ප්‍රජාශාලාවට පිවිසෙන මාර්ගයේ දමා ඇති බෝක්කු තුනක් අබලන්වි පස් හිරවී ජලය බැසයාමට නොහැකිව ඇතිබවත් එම හේතුවෙන් ඉඩම් ජලයෙන් යටවීම හා ගැටව ඇතිවි ඇතිබැවින් බෝක්කු තුනක් ලබා දුනහොත් ඒවා සවිකර පාර ජලය බැසයන ලෙස සැකසිය හැකි බවත් දන්වා ඇත.මෙම කරුන කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කරමු.

**08-07.**වෙනත් කරුනු.

සඳුදා දෙකට නගරය සම්බන්ද සාකච්ඡාවට සහභාගි වෙන්න.එසේම විශ්‍රාම ලබා යන කාර්මිකනිලධාරි ශිරන්ති මිය විසින් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට සුහද සමුදීමේ අවස්ථාවක් 22.11.24 දින ප.ව.2.00ට පැවැත්වීමට තීරනය කර තියෙනවා.ඒ සඳහා සහබාගි වන ලෙස ආරාධනා කර තිබෙනවා.

09-හදිසි යෝජනා 01-

**කාර්මික නිලධාරි එම්.ඒ.ටි.ශිරන්ති මියගේ සේවා කාලය දීර්ඝ කිරීම**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ සේවය කරන දැනට විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගෙන ඇති 22.11.24 දින විශ්‍රාම යාමට නියමිත කාර්මික නිලධාරි එම්.ඒ.ටි.ශිරන්ති මියගේ සේවා කාලය කොමසාරිස් අනුමැතිය ලබාගෙන මාස 06 කට දීර්ඝ කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මෙම සේවය අත්‍යවශ්‍ය නිසා කුමන හෝ පදනමක් මත අනුමැතිය ලබාගෙන සේවයේ යොදවා ගමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**දැනට සභාවේ කාර්මික නිලධාරි විසින් ඉටුකල යුතු විෂය කොටස් රාශියක් තිබෙනවා. ශිරන්ති මිය විසින් අධික්ෂනය කල කසල අංගනයේ කඩිනමින් පොහොර නිෂ්පාදනය කල යුතුයි. ඒ කටයුතු සඳහාද පල පුරුදු නිසා මෙම කාර්මික නිලධාරිනියගේ සේවය තවත් කාලයක් ලබා ගැනීම අවශ්‍යයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ හදිසි යෝජනාව අනුව **කුරුවිට ප්‍රාදේශීය සභාවේ සේවය කරන දැනට විශ්‍රාම පූර්ව නිවාඩු ලබාගෙන ඇති 22.11.24 දින විශ්‍රාම යාමට නියමිත කාර්මික නිලධාරි එම්.ඒ.ටි.ශිරන්ති මියගේ සේවා කාලය කොමසාරිස් අනුමැතිය ලබාගෙන මාස 06 කට දීර්ඝ කිරීමට** ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

09-හදිසි යෝජනා 02

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බෙ◌ාතේජු මහතා

**රජයෙන් ගර්භණී මව්වරුන්ට ලබාදෙන පෝෂණ දීමනාව ලබාදෙන ක්‍රමවේදය විධිමත් කිරිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බෙ◌ාතේජු මහතා

ප්‍රාදේශිය ලේකම් මේසම්බන්ධයෙන් කීවේ චක්‍ර ලේඛන අනුව ඒ කටයුතු සිදුවන බවයි.ගමේ පවුල්සෞඛ්‍යස්වා නිලධාරී,සමෘර්ධි නිලධාරි,ගිනුමක් ඇරඹීම,නැවත පවුල්සෞඛ්‍යස්වා නිලධාරී,නැවත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නැවත ග්‍රාමසේවක අත්සන් කරලා නැවත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිට ඉල්ලුම් පත්‍රය යොමුවෙන්නේ.ඇත්තටම මේක ආධාරයක් නෙවෙයි.පීඩාවක්.

ගර්භණී මව්වරුන්ට මේක දැඩි අපහසුතාවක්.කලින් මේවා නැහැ.ඉතා පහසුක්‍රමයක් තිබුනේ. පවුල්සෞඛ්‍යස්වා නිලධාරී අයදුම්පත්‍රය දුන්නාම පුරවලා නැවත පවුල්සෞඛ්‍යස්වා නිලධාරීනීට දුන්නාම ඒක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි යම් ලේඛනයක් එක්ක ප්‍රා◌ෙද්ශීය ලේකම්ට යොමු කරවනවා.

දැන් දැඩි කරදරයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

පැරණි ක්‍රමවේදයට කරන්න කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බෙ◌ාතේජු මහතා

රජයේ චක්‍ර ලේඛන වෙනස් කරන්න අපිට බෑ.නමුත් පහසු ක්‍රමයකට මේක කල හැකි විධිහක් අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිව හා ප්‍රා◌ෙද්ශීය ලේකම්ව කැදවලා සාකච්ඡා කල හැකියි. ඔබතුමා මුල් පුරවැසියා ලෙස ඔබතුමාට හැකියි මැදිහත්වෙන්න.මාස 4යි මේ ක තව දෙන්නේ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

දැඩි ක්‍රමවේදයක් නැතිව පහසු ක්‍රමයක් සාකච්ජා කරලා තීරනය කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බෙ◌ාතේජු මහතාගේ යෝජනාව අනුව රජයෙන් ගර්භණී මව්වරුන්ට ලබාදෙන පෝෂණ දීමනාව ලබාදෙන ක්‍රමවේදය පහසු ආකාරයෙන් සිදුකරගැනිම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හා ප්‍රා◌ෙද්ශීය ලේකම් සමඟ සාකච්ජා කර පහසු ක්‍රමයක් සැකසීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

09-හදිසි යෝජනා 03

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

වලදුරේ පරගලතැන්න ගමේ මාර්ගයේ වර්ෂාව හේතුවෙන් ගස්කඩාවැටි පළුදුවි ඇති මාර්ගය යථා තත්වයට පත්කිරීමට කොන්ක්‍රීට් කියුබ් දෙකක් හෝ ප්‍රිමික්ස් කියුබ් දෙකක් සභා අරමුදලින් ලබාදෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

වලදුරේ පරගලතැන්න ගමේ ගස් වර්ෂාවට කඩා වැටිලා.පාරේ තැනක් කඩාගෙන ගිහින්.දැඩි වර්ෂාවට තවත් හේදිලා යනවා.කොන්ක්‍රීට් කියුබ් දෙකක් හරි ප්‍රිමික්ස් කියුබ් දෙකක් හරි සභාවෙන් දෙන්න.ඉතිරි ටික ශ්‍රම දායකත්වයෙන් කරගන්න පුළුවන්.මෙය හදිසි ආපදා

තත්වයක්.ඒ මාර්ගයේ පයින් පවා ගමන්කිරිම දුෂ්කරවන අතර තව තවත් කඩාගෙන ගියොත් නඩත්තුවට විශාල මුදලක් යයි.සදුදාට කාර්මික නිලධාරිව යොමු කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**කාර්මික නිලධාරි යවා වාර්තා අරන් කටයුතුකරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ හදිසි යෝජනාව අනුව වලදූරේ පරගලතැන්න ගමේ මාර්ගයේ වර්ෂාව හේතුවෙන් ගස්කඩාවැටි පළුදුවී ඇති මාර්ගය යථා තත්වයට පත්කිරීමට කොන්ක්‍රිට් කියුබ් දෙකක් හෝ ප්‍රිමික්ස් කියුබ් දෙකක් කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන සභා අරමුදලින් ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

09-හදිසි යෝජනා 04.

**කිවුලකෙටුව නාන තොටුපල ප්‍රතිසංස්කරනය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් දේශප්‍රිය මහතා

**මෙනේරිපිටිය වසමේ කිවුලකෙටුව නාන තොටුපල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් දේශප්‍රිය මහතා

**මෙය රන්දුනු ලමා සමාජයේ ඉල්ලීමක්.රන්දුනු මල්ලි මියගියා.එතුමා වෙනුවෙන් ගමේ පිරිස එකතු වෙලා මෙනේරිපිටිය ට ජලය ලබාදෙන කිවිලකොටුව නාන තොටුපල ප්‍රතිසංස්කරනය කිරිමට තිරනය කලා. ශ්‍රම දායකත්වය ගමෙන් දෙන්න පුළුවන්. රන්දුනු මල්ලිගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

**රන්දුනු මල්ලිගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරමි.එතුමා විවිද ආකාරයේ සමාජ සේවා රැසක්කල අයෙක්.දන්සල්, බක්මහ සැනකෙලි,ආදි ගමේ විවිද කටයුතු වලට මුල් තැනක් දුන්නා.රන්දුනු ලමා සමාජයේ ඉල්ලිම හා ගමේ ඉල්ලිම අනුව සභා අරමුදලෙන් මෙම නාන තොටුපල ප්‍රතිසංස්කරනය කිරිම සඳහා ප්‍රතිපාදන ලබාදෙන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**කාර්මික නිලධාරි යවා වාර්තා අරන් කටයුතුකරමු**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් දේශප්‍රිය මහතා ගේ හදිසි යෝජනාව අනුව මෙණේරිපිටිය වසමේ කිවුලකෙටුව නාන තොටුපල ප්‍රතිසංස්කරනය කිරීම සඳහා කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන සභා අරමුදලින් ප්‍රතිපාදන ලබා දීමට ඒකමතිකව** මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxx**

**2022.11.11 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද මහා සභාවේ හදිසි යෝජනා අංක 09-05 හි උද්ධෘතය**

09-හදිසි යෝජනා 05.

කුරුවිට කුඩා නගර ජල යෝජනා ක්‍රමය සඳහා ජලමෝටරයක් හා උපාංග මිලදී ගැනීම.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කුරුවිට කුඩා නගර ජල යෝජනා ක්‍රමය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ලබාදුන් පිරිවිතර වලට අනුව ජල මෝටරයක් සහ හා ඊට අදාල පොම්පයක් මිලදී ගැනීමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත්කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

එම යෝජනාව ස්ථිර කරමි. මේ කටයුතු කඩිනම් කරන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කුරුවිට කුඩා නගර ජල යෝජනා ක්‍රමය සඳහා ජල මෝටරයක් සහ හා ඊට අදාල පොම්පයක්. මිලදී ගැනිම අතවශ්‍ය නිසා අපි මේ සම්බන්ධව ජාතික ජලසම්පත් මණ්ඩලයෙන් උපදෙස් ඉල්ලුවා.22.11.04 දිනැතිව , ජලසම්පත් මණ්ඩලයේ ඉංජිනේරු මහතා අපිට උපදෙස්, පිරිවිතර එවා තියෙනවා. ඒ නිසා මේ සම්බන්ධව නිත්‍යානුකූලව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ විසින් ඉදිරිපත්කරන ලද හදිසි යෝජනාව අනුව කුරුවිට කුඩා නගර ජල යෝජනා ක්‍රමය සඳහා ජාතික ජල සම්පාදන**

හා ජලාපවාහන මණ්ඩලය විසින් ලබාදුන් පිරිවිතර වලට අනුව ජල මෝටරයක් සහ හා ඊට අදාල පොම්පයක් මිලදී ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**2022.11.11 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද මහා සභාවේ හදිසි යෝජනා අංක 09-05 හි උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්. ආර්.විරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

9-05. නිවාඩු අනුමත කිරීම

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් රුවන් කුමා ර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල්සිරි ජයලත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදිප් මහතා ගරු ප්‍රාදේශීය සභා යසසිරි ප්‍රභාත් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා හදිසියේ_අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් රුවන් කුමා ර මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල්සිරි ජයලත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදිප් මහතා ගරු ප්‍රාදේශීය සභා යසසිරි ප්‍රභාත් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා

**හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දීමට** අනුමත කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

- **ස්තූතිය.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

අද දින මහා සභාවට සංග්‍රහ කටයුතු සිදුකල ගරු නයනා ජීවනී මන්ත්‍රිතුමිය,ගරු චන්ද්‍රලතා බණ්ඩාර මන්ත්‍රීතුමිය, ගරු ඉන්ද්‍රාණී වික්‍රමසිංහ මන්ත්‍රිතුමිය,මානෙල් කරඳන මන්ත්‍රිතුමිය වෙත විශේෂ ස්තූතිය පල කරමු. සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි.

සභාවේ කටයුතු ප.ව. 2.00 ට  පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)